### පළමු උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය සභා සීමා ඇතුළත කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 154A, කහෙන්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කහෙන්ගම ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් සහතික කරන ලද කැඩැස්තර සිතියම් අංක 620283 හි දැක්වෙන ඉඩම් කොටස් අංක 93 ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් එකයි දශම අටයි එකයි පහයි පහක (හෙක්ටෙයාර් 1.8155) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය රත්නපුර හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සහතික අංක 00330059873 : රත්නපුර යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී කැඩැස්තර සිතියමේ ඉඩම් කොටස් අංක 10 මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය සමග වේ.

**යන්ත්‍රෝපකරණ සහ ඊට අමුණන ලද සවිකිරීම් සමග**

| *Name of the Machine* | *Make & Model* | *Size* | *Capacity* | *Origin* | *No. of Units* |
|---|---|---|---|---|---|
| **Upper Floor** | | | | | |
| Withering Troughs | Green Island | 60'X6' | 900Kgs/day | Sri Lanka | 8 |
| Withering Troughs | Green Island | 58'X6' | 880Kgs/day | Sri Lanka | 7 |
| **Ground Floor** | | | | | |
| Rollers | Gamini 47 | 47" | 350Kgs/20m | Sri Lanka | 2 |
| | CCC 47 | 47" | 350Kgs/20m | Sri Lanka | 3 |
| | Walkers | 47" | 350Kgs/20m | Sri Lanka | 1 |
| | Walkers | 36" | 225Kgs/20m | Sri Lanka | 1 |
| Roll Brakers | | 12.5'X 3.5' | 500Kgs/10m | Sri Lanka | 4 |
| Drier (with cyclone) | Conquest | 6' | 225Kgs/hr | | 1 |
| Drier | Siricco | 6' | 225Kgs/hr | | 1 |
| Automated Conveyor System | | | | Sri Lanka | 1 |
| Chota Shifter | | | | | 1 |
| Michie Shifter | | | | | 9 |
| Midleton Shifters | | | | | 3 |
| Fiber Mats | | | 400Kgs/hr | Sri Lanka | 2 |
| Winovers | | | 600Kgs/hr | | 3 |
| Tea Cutters | | | | | 4 |
| 3T Stalk Extractor | | | 500Kgs/hr | Sri Lanka | 1 |
| Colour Separator | Timing MAKA 9 - SN 25625065, 10 cams | | 500Kgs/hr | Korea | 1 |

| *Name of the Machine* | *Make & Model* | *Size* | *Capacity* | *Origin* | *No. of Units* |
|---|---|---|---|---|---|
| | Timing MAKA 9 - SN 38425093, 12 cams | | 500Kgs/hr | Korea | 1 |
| | Jie - xun DCS 4000C | | 450Kgs/hr | China | 1 |
| | Senvec GTS 1200B | | 250Kgs/hr | Japan | 1 |
| Generator | Perkings P 250 | | 250KVA | England | 1 |
| Elevator System | | | | Sri Lanka | 1 |
| Firewood Splitter | | | | Sri Lanka | 1 |
| Humid Fire | | | | | 4 |

කුරුවිට, පැරඩයිස්, ඉසුරු පෙදෙස හි "පීක් පැරඩයිස් තේ කර්මාන්තශාලාව" හි සාමාන්‍යයෙන් තබා ඇති ඉහත යන්ත්‍රෝපකරණ සියල්ල.

**දෙවන උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය සහා සීමා ඇතුළත කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 154A, කහෙන්ගම ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත කහෙන්ගම ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් සහතික කරන ලද කැඩැස්තර සිතියම් අංක 620283 හි දැක්වෙන ඉඩම් කොටස් අංක 0110 ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් බිංදුවයි දශම දෙකයි එකයි තුනයි හතක (හෙක්ටෙයාර් 0.2137) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය රත්නපුර හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සහතික අංක 00330059839 : රත්නපුර යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී කැඩැස්තර සිතියමේ ඉඩම් කොටස් අංක 96 මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය සමග වේ.

**තුන්වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සහා සීමා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 63, කුරුඳුවත්ත කොට්ඨාසයේ, කොළඹ 7, කුරුඳුවත්ත, රොස්මීඩ් පෙදෙස, වරිපනම් අංක 51/1 දරන ස්ථානයේ පිහිටි "ඔලැන්ඩෝ හවුස්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. කපිල එල්. එදිරිසිංහ විසින් 2018 අගෝස්තු මස 20 දින පිළියෙල කරන ලද අංක 2390 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට: අංක 1171/2007 දරන පිඹුරේ ලොට් $E^{1A}$, විජේරාම මාවතේ, වරිපනම් අංක 6/3 දරන පරිශ්‍රය මගින් ද; නැගෙනහිරට : අංක 3436 දරන පිඹුරේ ලොට් F සහ රොස්මීඩ් පෙදෙස, වරිපනම් අංක 53 දරන පරිශ්‍රය මගින් ද; දකුණට : මෙහි ලොට් 2 සහ අංක 2239 දරන පිඹුරේ ලොට් 2, රොස්මීඩ් පෙදෙස, වරිපනම් අංක 51 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : රොස්මීඩ් පෙදෙස, වරිපනම් අංක 47/1 සහ 45 දරන පරිශ්‍රය මගින් ද මායිම් වූ එකී අංක 2390 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාහතයි දශම හයයි හතක (පර්. 17.67) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන්, පස සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව E 190/84 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු කේ. ඒ. කපිල එල්. එදිරිසිංහ විසින් 2018 අගෝස්තු මස 20 දින පිළියෙල කරන ලද අංක 2390 දරන පිඹුරේ ලොට් 2 සහ බලයලත් මිනින්දෝරු, ඩබ්. ඩී. බෙල්ලන විසින් 2008.01.28 දින පිළියෙල කරන ලද අංක 1184/2008 දරන පිඹුරේ ලොට් 1B ලෙස එසේම දැක්වෙන තුළ මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය සමග වේ.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2025 සැප්තැම්බර් මස 30 දින.

11 - 330

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**
**- කුරුවිට ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

කංකානම්ගේ දොන් නිරෝෂ තුෂාන් කුමාර උපසේන
ණය ගිණුම් අංක : 3357133 සහ 2947185

2025 සැප්තැම්බර් මස 30 දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කේ. එල්. ඩබ්. අබේරත්න විසින් 2018 සැප්තැම්බර් මස 28 දින සහතික කරන ලද උකස් සාධන පත්‍රයක් මගින් මෙහි පහත පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපළ (සහ/ හෝ මින්මතු සඳහන් කරන උකස් සාධන පත්‍රයේ උපලේඛනයේ) උකස් කොට බැඳ දමා ඇති, වෙනත් කරුණු අතර, කොළඹ 07, රොස්මීඩ් පෙදෙසේ, අංක 51/1 දරන ස්ථානයේ කංකානම්ගේ දොන් නිරෝෂ තුෂාන් කුමාර උපසේන ණයකරු සහ/හෝ උකස්කරු හැටියට සහ ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් සාධන පත්‍රය යටතේ ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම එකී කංකානම්ගේ දොන් නිරෝෂ තුෂාන් කුමාර උපසේන පැහැර හැර ඇති හෙයින්,

සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. අල්විස් විසින් 2022 ජූලි මස 9 දින සහතික කරන ලද අංක 1796 දරන උකස් බැඳුම්කරයක් මගින් මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපළ (සහ/හෝ මින්මතු සඳහන් කරන උකස් බැඳුම්කරයේ උපලේඛනයේ) උකස් කොට බැඳ දමා ඇති, වෙනත් කරුණු අතර, එකී කංකානම්ගේ දොන් නිරෝෂ තුෂාන් කුමාර සහ වෙනත් කරුණු අතර, ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්. සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් බැඳුම්කරය යටතේ ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම එකී කංකානම්ගේ දොන් නිරෝෂ තුෂාන් කුමාර උපසේන පැහැර හැර ඇති හෙයින්,

සහ මෙහි පහත පෙන්වන පරිදි, ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 3357133 සම්බන්ධයෙන් මුල් මුදල සහ පොළිය සහ නිවාස ණය අංක 2947185 සම්බන්ධයෙන් මුල් මුදලේ කොටස වශයෙන් වෙනත් කරුණු අතර, 2025 ජූලි මස 24 දින වනවිට රුපියල් මිලියන අසූ එකයි අට ලක්‍ෂ අනූ හය දහස් හත්සිය හතරයි ශත නවයක (රු. 81,896,704.09) මුදලක් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැනට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන අසූ එකයි අට ලක්‍ෂ අනූ හය දහස් හත්සිය හතරයි ශත නවයක (රු. 81,896,704.09) මුදල අයකර ගැනීම සඳහා පහත විස්තර කරන ලද පරිදි, වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට ඉහත කී උකස් බැඳුම්කරය සහ/හෝ උකස් සාධන පත්‍රය යටතේ, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනයන් හි සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද යන්ත්‍රෝපකරණ සහ ඊට අමුණන ලද සවිකිරීම් සමග දේපළ කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ අරච්චාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි:-

(*a*) ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 3357133 සඳහා රු. 15,176,704.09 ක මුළු මුදලක් (2025 ජූලි මස 24 දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2025 ජූලි මස 25 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 13,670,000.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 15% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(*b*) ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2947185 සඳහා රු. 66,720,000.00 ක මුදලක් (මුල් මුදලේ කොටසක්) සහ 2025 ජූලි මස 24 දින වන විට සහ 2025 ජූලි මස 25 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 66,720,000.00ක එකී මුදල මත වර්ෂයකට 13% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් වේ.

**පළමු උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය සභා සීමා ඇතුළත කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 154A, කහෙන්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කහෙන්ගම ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල්වරයා විසින් සහතික කරන ලද කැඩැස්තර සිතියම් අංක 620283 හි දැක්වෙන ඉඩම් කොටස් අංක 93 ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් එකයි දශම අටයි එකයි පහයි පහ (හෙක්ටෙයාර් 1.8155)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය රත්නපුර හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සහතික අංක 00330059873 : රත්නපුර යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී කැඩැස්තර සිතියමේ ඉඩම් කොටස් අංක 10 මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය සමග වේ.

යන්ත්‍රෝපකරණ සහ ඊට අමුණන ලද සවිකිරීම් සමග

| *Name of the Machine* | *Make & Model* | *Size* | *Capacity* | *Origin* | *No. of Units* |
|---|---|---|---|---|---|
| **Upper Floor** | | | | | |
| Withering Troughs | Green Island | 60'X6' | 900Kgs/ day | Sri Lanka | 8 |
| Withering Troughs | Green Island | 58'X6' | 880Kgs/ day | Sri Lanka | 7 |
| **Ground Floor** | | | | | |
| Rollers | Gamini 47 | 47" | 350Kgs/ 20m | Sri Lanka | 2 |
| | CCC 47 | 47" | 350Kgs/ 20m | Sri Lanka | 3 |
| | Walkers | 47" | 350Kgs/ 20m | Sri Lanka | 1 |

| *Name of the Machine* | *Make & Model* | *Size* | *Capacity* | *Origin* | *No. of Units* |
|---|---|---|---|---|---|
| | Walkers | 36" | 225Kgs/ 20m | Sri Lanka | 1 |
| Roll Brakers | | 12.5'X 3.5' | 500Kgs/ 10m | Sri Lanka | 4 |
| Drier (with cyclone) | Conquest | 6' | 225Kgs/ hr | | 1 |
| Drier | Siricco | 6' | 225Kgs/ hr | | 1 |
| Automated Conveyor System | | | | Sri Lanka | 1 |
| Chota Shifter | | | | | 1 |
| Michie Shifter | | | | | 9 |
| Midelton Shifters | | | | | 3 |
| Fiber Mats | | | 400Kgs/ hr | Sri Lanka | 2 |
| Winovers | | | 600Kgs/ hr | | 3 |
| Tea Cutters | | | | | 4 |
| 3T Stalk Extractor | | | 500Kgs/ hr | Sri Lanka | 1 |
| Colour Separator | Triming MAKA 9 - SN 25625065, 10 cams | | 500Kgs/ hr | Korea | 1 |
| | Triming MAKA 9 - SN 38425093, 12 cams | | 500Kgs/ hr | Korea | 1 |
| | Jie - xun DCS 400C | | 450Kgs/ hr | China | 1 |
| | Senvec GTS 1200B | | 250Kgs/ hr | Japan | 1 |
| Generator | Perkings P 250 | | 250KVA | England | 1 |
| Elevator System | | | | Sri Lanka | 1 |
| Firewood Splitter | | | | Sri Lanka | 1 |
| Humid Fire | | | | | 4 |

කුරුවිට, පැරඩයිස්, ඉසුරු පෙදෙස හි "පීක් පැරඩයිස් තේ කර්මාන්තශාලාව" හි සාමාන්‍යයෙන් තබා ඇති ඉහත යන්ත්‍රෝපකරණ සියල්ල.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 63, කුරුඳුවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොළඹ 7, කුරුඳුවත්ත, රොස්මීඩ් පෙදෙස, වරිපනම් අංක 51/1 දරන ස්ථානයේ පිහිටි "ඔලැන්ඩෝ හවුස්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. කපිල එල්. එදිරිසිංහ විසින් 2018 අගෝස්තු මස 20 දින පිළියෙල කරන ලද අංක 2390 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්: උතුරට: අංක 1171/2007 දරන පිඹුරේ ලොට් $E^{1A}$, විජේරාම මාවතේ, වරිපනම් අංක 6/3 දරන පරිශ්‍රය මගින් ද; නැගෙනහිරට : අංක 3436 දරන පිඹුරේ ලොට් F සහ රොස්මීඩ් පෙදෙස, වරිපනම් අංක 53 දරන පරිශ්‍රය මගින් ද; දකුණට : මෙහි ලොට් 2 සහ අංක 2239 දරන පිඹුරේ ලොට් 2, රොස්මීඩ් පෙදෙස, වරිපනම් අංක 51 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : රොස්මීඩ් පෙදෙස, වරිපනම් අංක 47/1 සහ 45 දරන පරිශ්‍රය මගින් ද මායිම් වූ එකී අංක 2390 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාහතයි දශම හයයි හත (පර්. 17.67)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන්, පස සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/ පත්‍රිකාව E 190/84 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු කේ. ඒ. කපිල එල්. එදිරිසිංහ විසින් 2018 අගෝස්තු මස 20 දින පිළියෙල කරන ලද අංක 2390 දරන පිඹුරේ ලොට් 2 සහ බලයලත් මිනින්දෝරු, ඩබ්. ඩී. බෙල්ලන විසින් 2008.01.28 දින පිළියෙල කරන ලද අංක 1148/2008 දරන පිඹුරේ ලොට් 1B ලෙස එසේම දැක්වෙන තුළ මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය සමග වේ.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2025 සැප්තැම්බර් මස 30 දින.

11 - 328

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. ටී. එම්. ඉෆ්තිකාර් සහ ඒ. එච්. කේ. මරීෆා
ගිණුම් අංකය : 0193 5001 1075

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.09.24 දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. ආර්. උදයංග විසින් ලියා සහතික කරන ලද 2018 මාර්තු මස 29 දාතම හා අංක 311 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොහමඩ් තව්ෆීක් මොහමඩ් ඉෆ්තිකාර් සහ අබ්දුල් හමීඩ් කන්සුල් මරීෆා බන්ධනදායීන් වශයෙන් හා එකී මොහමඩ් තව්ෆීක් මොහමඩ් ඉෆ්තිකාර් උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 311 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අනූ පන් ලක්ෂ දහස් හත්සිය හතළිස් හයයි ශත හැටක (රු. 9,585,746.60) මුදලක් 2025 ජූලි මස 29 දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී අනූ පන් ලක්ෂ අසූ පන් දහස් හත්සිය හතළිස් හයයි ශත හැටක (රු. 9,585,746.60) මුදල ද, 2025 ජූලි මස 30 දින සිට අංක 311 උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූපන් ලක්ෂ හැත්තෑ නව දහස් හත්සිය තිස් හතරයි ශත පනස් හයක (රු. 8,579,734.56) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 311 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සහ පරිපාලන සීමාවන් තුළ සහ කොළඹ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කෙහෙල්වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වෝඩ් අංක 18, කෙහෙල්වත්ත, විල්සන් වීදියේ පිහිටි විල්සන් වීදිය, වරිපනම් අංක 15 දරන ඉඩමට බලයලත් මානක තැන කේ. කනගසිංහම් විසින් සාදන ලද 2017 අගෝස්තු මස 14 දාතම හා අංක 5142 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් X වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පැසේජය; නැගෙනහිරට : පැසේජය සහ විල්සන් වීදිය, වරිපනම් අංක 19 දරන පරිශ්‍රයන්; දකුණට : විල්සන් වීදිය සහ බස්නාහිරට : විල්සන් වීදිය, වරිපනම් අංක 11 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම එකයි අටක් (පර්. 3.18) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 5142 දරන පිඹුරට අනුවය.

එකී ලොට් X පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී වෝඩ් අංක 18, කෙහෙල්වත්ත, විල්සන් වීදියේ පිහිටි විල්සන් වීදිය, වරිපනම් අංක 15 දරන ඉඩමට බලයලත් මානක තැන එම්. අයි. එල්. මරිකාර් විසින් සාදන ලද 1933 අගෝස්තු මස 27 දාතම හා අංක 0972 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට වරිපනම් අංක 15 දරන ඉඩම් කොටසට මායිම්: උතුරට : පැසේජය; නැගෙනහිරට : පැසේජය සහ වරිපනම් අංක 19 දරන පරිශ්‍රයන්; දකුණට : විල්සන් වීදිය සහ බස්නාහිරට: විල්සන් වීදිය, වරිපනම් අංක 11 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම එකයි අටක් (පර්. 3.18) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 0972 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 214/52 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11 - 270

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

පාම් ගාර්ඩන් විලේජ් ෆෙරාරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංකය : 0021 1000 1412

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.06.25 දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ඒ. ඩබ්ලිව්. එස්. කල්හාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2013 මැයි මස 03 දාතම හා අංක 175 සහ 2013 ජූලි මස 05 දාතම හා අංක 222 දරන උකස් බැඳුම්කර දෙක සහ ඒ. ජී. කේ. අලෝකබන්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2013 දෙසැම්බර් 18 දාතම හා අංක 123, 2014 සැප්තැම්බර් මස 23 දාතම හා අංක 293, 2022 ඔක්තෝබර් මස 25 දාතම හා අංක 2106 යන උකස් බැඳුම්කර සියල්ල සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. නාගොඩවිතාන යන අය විසින් ලියා සහතික කරන ලද 2019 ජූනි මස 27 දාතම හා අංක 2949 දරන උකස් බැඳුම්කරය යන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති බදුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 2734 දරන ශ්‍රී ලංකා සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක් වන ෆාම් ගාර්ඩන් විලේජ් ෆෙරාරීස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 175, 222, 123, 293, 2106 සහ 2949 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එකසිය දස කෝටි දහසය ලක්ෂ තුන් දහස් පන්සිය හතළිස් පහයි ශත හැත්තෑ හතරක (රු. 1,101,603,545.74) මුදලක් 2025 අප්‍රේල් මස 06 දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එකසිය දස කෝටි දහසය ලක්ෂ තුන් දහස් පන්සිය හතළිස් පහයි ශත හැත්තෑ හතරක (රු. 1,101,603,545.74) මුදල ද, 2025 අප්‍රේල් මස 07 දින සිට අංක 175, 222, 123, 293, 2106 සහ 2949 දරන උකස් බැඳුම්කර මත අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි එක් කෝටි පනස් අට ලක්ෂ අනූ දෙදහස් තුන්සිය අසූ හතරයි ශත අසූ හයක (රු. 215,892,384.86) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) Twelve Months and thereafter Average Weighted Prime Lending Rate + Naught per centum (AWPLR + 0% p.a.) per annum හා තවත් රුපියල් හැත්තෑ දෙකෝටි අනූ ලක්ෂයක (රු. 729,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Naught per centum (AWPLR + 0% p.a.) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 175, 222, 123, 293, 2106 සහ 2949 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ විලච්චිය කෝරළේ, නොච්චියාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අන්දරවැව, අංක 341 ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, අන්දරවැව ග්‍රාමයේ පිහිටි "බැඳපුවලේමූකලාන" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද 2012 අගෝස්තු මස 17 දාතම හා ෂීට් අංක 33 (අතිරේක අංක 30) අංක F.V.P. 663 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1083 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : ලොට් 829, 960, 957, 954, 951, 948, 946, 937 සහ 1086; නැගෙනහිරට : 1086; දකුණට : 1086 සහ බස්නාහිරට: 1086, 1085, 1084, 834, 831 සහ 829 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර දහ නවයයි දශම අටයි දෙකයි නවයයි හතක් (19.8297 Hectares) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/ පත්‍රුව M 03/38 යටතේ අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11 - 324

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඒ. එම්. එන්. ඒ. අබේකෝන්
ගිණුම් අංකය : 0217 5000 1731

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.07.30 දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ආර්. ජී. ඩී. සුනාරි විසින් ලියා සහතික කරන ලද 2018 මැයි මස 22 දාතම හා අංක 6066 දරන, 2019 ජනවාරි මස 25 දාතම හා අංක 6340 දරන උකස් බැඳුම්කර දෙක, එච්. සී. ලක්මිණි විසින් ලියා සහතික කරන ලද 2021 මාර්තු මස 25 දාතම හා අංක 1621 දරන, 2022 සැප්තැම්බර් මස 20 දාතම හා අංක 2311 දරන, 2023

අප්‍රේල් මස 25 දාතම හා අංක 2398 දරන, 2023 දෙසැම්බර් මස 18 දාතම හා අංක 2520 දරන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අබේකෝන් මුදියන්සේලාගේ නිමේෂ අනුරාධ අබේකෝන් බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 6066, 6340, 1621, 2311, 2398 සහ 2520 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අට කෝටි හැට හය ලක්ෂ දහ අට දහස් හතළිහයි ශත අනූවක (රු. 86,618,040.90) මුදලක් 2025 අප්‍රේල් මස 06 වැනි දිනට එකී අංක 6066, 1621, 2311, 2398 සහ 2520 දරන උකස් බැඳුම්කර, එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අට කෝටි හැට හය ලක්ෂ දහ අට දහස් හතළිහයි ශත අනූවක (රු. 86,618,040.90) මුදල ද, 2025 අප්‍රේල් මස 07 දින සිට අංක 6066, 6340, 6340, 1621, 2311, 2398 සහ 2520 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් කෝටි හැට හතර ලක්ෂ හැත්තෑ දහසක (රු. 76,470,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 6066, 6340, 1621, 2311, 2398 සහ 2520 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, කැලණිය (දළුගම ඒකකය) ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ කැලණිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, දළුගම (258/A) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දළුගම ග්‍රාමයේ පිහිටි "කෝන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. බී. බුද්ධිසේන විසින් සාදන ලද 2009 දෙසැම්බර් මස 03 දාතම හා අංක 1348/2009 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: ඩබ්ලිව්. එම්. බර්නාඩ් පෙරේරා සහ වෙනත් අයගේ ඉඩම; නැගෙනහිරට: ප්‍රාදේශීය සභා පාර; දකුණට : අංක 165/1991 දරන පිඹුරේ ලොට් 2 හි ඉතිරි කොටස සහ ලොට් 2A සහ බස්නාහිරට : ජයවීර ලෝගුස් සහ ඊ. එම්. සුසිල්ගේ ඉඩම් සහ එම්. ඩබ්ලිව්. බර්නාඩ් පෙරේරාගේ සහ වෙනත් අයගේ ඉඩම සහ පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (රූ.1) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 1348/2009 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රය G 398/27 යටතේ මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11 - 320

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින් වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

සිවා ටෙක්ස්ටයිල්ස්
ගිණුම් අංකය : 0193 1000 8039

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.09.24 දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන සී. ජී. අබේවික්‍රම විසින් ලියා සහතික කරන ලද 2021 ජනවාරි මස 21 දාතම හා අංක 4165 දරන උකස් බැඳුම්කරය සහ ඩී. මධුහාසිනී විසින් ලියා සහතික කරන ලද 2025 සැප්තැම්බර් මස 04 දාතම හා අංක 1189 දරන නිවැරදි කිරීමේ ඔප්පුව මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට ලබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "සිවා ටෙක්ස්ටයිල්ස්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන බාලසිංගම් සිවතාස් බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4165 උකස් බැඳුම්කරය සහ අංක 1189 දරන නිවැරදි කිරීමේ ඔප්පුව ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙකෝටි හතළිස් ලක්ෂ අනූ හතර දහස් හත්සිය දහ හතයි ශත හතළිස් අටක (රු. 24,094,717.48) මුදලක් 2025 ජූලි මස 29 වැනි දිනට එකී අංක 4165 උකස් බැඳුම්කරය සහ අංක 1189 දරන නිවැරදි කිරීමේ ඔප්පුව, එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙකෝටි හතළිස් ලක්ෂ අනූ හතර දහස් හත්සිය දහ හතයි ශත හතළිස් අටක

(රු. 24,094,717.48) මුදල ද, 2025 ජූලි මස 30 වැනි දින සිට එකී අංක 4165 උකස් බැඳුම්කරය සහ අංක 1189 දරන නිවැරදි කිරීමේ ඔප්පුව මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි දොළොස් ලක්ෂ අනූ තුන් දහස් හාරසිය හතළිස් හයයි ශත හැත්තෑ හයක (රු. 21,293,446.76) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 4165 උකස් බැඳුම්කරය සහ අංක 1189 දරන නිවැරදි කිරීමේ ඔප්පුව මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල (හැඳල උප කාර්යාල) ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ වත්තල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පල්ලියවත්ත උතුර (ග්‍රා. නි. කො. අංක 168A) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කාර්මල් මාවත, වරිපනම් අංක 95 දරන කාර්මල් මාවත, වම හැඳළ, පල්ලියවත්ත පිහිටි "අලිබ් ලොප් *නොහොත්* හැඳල ෆාම්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. එස්. කේ. හේරත් විසින් සාදන ලද 2020 සැප්තැම්බර් මස 05 දාතම හා අංක 1110 - C/2020 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පී. සී. පෙරේරාගේ ඉඩම; නැගෙනහිරට : කාර්මල් මාවත; දකුණට: කාර්මල් මාවත සහ පාර (ප්‍රාදේශීය සභා) සහ බස්නාහිරට : පාර (අඩි 12 පළල පුද්ගලික පාර) සහ බලයලත් මානක තැන එස්. ජී. ගුණතිලක විසින් සාදන ලද අංක 5152 දරන පිඹුරේ ලොට් 12A1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතයි දශම බිංදුවක් (රූ.1, පර්. 7.0) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1110-C/2020 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් 1 බලයලත් මානක තැන එස්. ජී. ගුණතිලක විසින් සාදන ලද 2020 ජූලි මස 22 දාතම හා අංක 12149 දරන පිඹුරේ නිරූපිත ලොට් 12A2 හි නැවත මිනුමක් සහ තවත් අයුරකින් පහතින් මැනවින් විස්තර කොට ඇති පහත ඉඩමේ නැවත මිනුමකි.

එකී හැඳළ පිහිටි "අලිබ් ලොප් *නොහොත්* හැඳළ ෆාම්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද 2008 මාර්තු මස 24 දාතම හා අංක 5580 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 12A2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 16 දරන පිඹුරේ ලොට් 07; නැගෙනහිරට : කාර්මල් මාවත; දකුණට : කාර්මල් මාවත සහ අඩි 15 පළල පාර (ලොට් 9) සහ බස්නාහිරට : අංක 5152 දරන පිඹුරේ ලොට් 12A1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතක් (රූ.1, පර්. 7) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 5580 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව L 443/122 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11 - 321

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ද බ්‍රිටිෂ් හබ් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංකය : 0064 1000 4311

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.10.21 දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සී. රන්ගම යන අය විසින් ලියා සහතික කරන ලද 2021 සැප්තැම්බර් මස 24 දාතම හා අංක 3672 සහ 3674 දරන සහ 2022 මාර්තු මස 07 දාතම හා අංක 3864 දරන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 00213320 දරන ශ්‍රී ලංකා සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක් වන ද බ්‍රිටිෂ් හබ් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් හා ගනේගොඩ විතාරමාලගේ චමිලා සාරංගා *නොහොත්* ගනේගොඩ විතාරමාලගේ චමිලා සාරංගා ගනේගොඩ උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 3672, 3674 සහ 3864 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාර කෝටි අසූ නව ලක්ෂ හැත්තෑ අට දහස්

නවසිය අසූ පහයි ශත තිස් අටක (රු. 48,978,985.38) මුදලක් 2025 සැප්තැම්බර් මස 29 දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හාර කෝටි අසූ නව ලක්ෂ හැත්තෑ අට දහස් නවසිය අසූ පහයි ශත තිස් අටක (රු. 48,978,985.38) මුදල ද, 2025 සැප්තැම්බර් මස 30 දින සිට අංක 3672, 3674 සහ 3864 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් කෝටි හැට හය ලක්ෂ හැට අට දහසක (රු. 36,668,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම බිංදුවක් (12.0%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 3672, 3674 සහ 3864 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කිරිල්ලවල - බටහිර, අංක 287/C දරන ග්‍රාම සේවා කොට්ඨාසය තුළ කිරිල්ලවල පිහිටි "රෙවිආර එස්ටේට් (හික්ගහවත්ත සහ දවටගහවත්ත)" යයි කියනු ලබන සහ හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඒ. රූපසිංහ යන අය විසින් සාදන ලද 1991 පෙබරවාරි මස 09 දාතම හා අංක 80/1991 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් C1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : අංක 671 දරන පිඹුරේ ලොට් 17 (පාර); ගිණිකොනට : අංක 671 දරන පිඹුරේ ලොට් 17 (පාර); නිරිතට : අංක 245/26 දරන පිඹුරේ ලොට් 25 සහ ලොට් C හි ඉතිරි කොටස සහ වයඹට : ලොට් C හි ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහක් (පර්. 12) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 80/1991 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව M 604/93 යටතේ ගම්පහ දැන් මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් C1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී කිරිල්ලවල පිහිටි "රෙවිආර එස්ටේට් (හික්ගහවත්ත සහ දවටගහවත්ත)" යයි කියනු ලබන සහ හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2015 සැප්තැම්බර් 05 දාතම හා අංක 988/2015 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් C1/1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : සුහද මාවත; ගිණිකොනට: කේ. බී. වික්‍රමසිංහගේ ඉඩම; නිරිතට : අංක 245/26 දරන පිඹුරේ ලොට් 25 සහ ජී. ඩබ්ලිව්. සෝමරත්නගේ ඉඩම සහ වයඹට: ජී. ඩබ්ලිව්. සෝමරත්නගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හතරක් (පර්. 11.4) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 988/2015 දරන පිඹුරට අනුව ය.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කිරිල්ලවල - බටහිර, අංක 287/C දරන ග්‍රාම සේවා කොට්ඨාසය තුළ කිරිල්ලවල පිහිටි "හික්ගහවත්ත සහ දවටගහවත්ත" යයි කියනු ලබන සහ හඳුන්වනු ලබන ඉඩමට (බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2013 ජූනි මස 19 දාතම හා අංක 677/2013 දරන පිඹුරේ ලොට් B3/1 හි කොටස වන) බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2014 අප්‍රේල් මස 29 දාතම හා අංක 474/2014 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B3/1/1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : සුහද මාවත (දැන් සහන මාවත); ගිණිකොනට : ලොට් B3/1/1; නිරිතට : මෙම ඉඩමේ ලොට් B හි ඉතිරි කොටස සහ වයඹට: කරුණාසේන සහ රෝහිත සමරසිංහ දිසානායක විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි එකක් (පර්. 21) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 474/2014 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව M 181/105 යටතේ ගම්පහ දැන් මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කිරිල්ලවල - බටහිර, අංක 287/C දරන ග්‍රාම සේවා කොට්ඨාසය තුළ කිරිල්ලවල පිහිටි "හික්ගහවත්ත සහ දවටගහවත්ත" යයි කියනු ලබන සහ හඳුන්වනු ලබන ඉඩමට (බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2013 ජූනි මස 19 දාතම හා අංක 677/2013 දරන පිඹුරේ ලොට් B3/1 හි ඉතිරි කොටස වන) බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2014 අප්‍රේල් මස 29 දාතම හා අංක 474/2014 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B3/1/2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : සුහද මාවත සහ කේ. ඩී. එන්. සේපාලි, කේ. ඩී.

එන්. ජයන්ති සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම; ගිණිකොණට =: කේ. ඩී. එන්. සේපාලි, කේ. ඩී. එන්. ජයන්ති සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම; නිරිතට : මෙම ඉඩමේ ලොට් D සහ වයඹට : ලොට් B3/1/1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි අටයි දශම හයක් (පර්. 21.6) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 474/2014 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M 517/28 යටතේ ගම්පහ දැන් මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 474/2014 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් B3/1/1 සහ B3/1/2 එකට යාකොට ඇති අතර පහතින් මැනවින් විස්තර වේ. -

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කිරිල්ලවල - බටහිර, අංක 287/C දරන ග්‍රාම සේවා කොට්ඨාසය තුළ කිරිල්ලවල පිහිටි "හික්ගහවත්ත සහ දවටගහවත්ත" යයි කියනු ලබන සහ හඳුන්වනු ලබන ඉඩමට (බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2013 ජුනි මස 19 දාතම හා අංක 677/2013 දරන පිඹුරේ ලොට් B3/1 හි නැවත මිනුමක් වන) බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2014 අප්‍රේල් මස 29 දාතම හා අංක 474/2014 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B3/1/1 සහ B3/1/2 වශයෙන් ලකුණුකොට එකට යාකොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : සුහද මාවත; ගිණිකොනට : කේ. ඩී. එන්. සේපාලි, කේ. ඩී. එන්. ජයන්ති සහ වෙනත් අයගේ ඉඩම; නිරිතට : මෙම ඉඩමේ ලොට් B කොටස සහ මෙම ඉඩමේ ලොට් D සහ වයඹට : කරුණාසේන සහ රෝහිත සමරසිංහ දිසානායක විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් නවයයි දශම හයක් (රූ.1, පර්. 9.6) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 474/2014 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M 862/128 යටතේ ගම්පහ දැන් මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එන්. එස්. එල්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1966 දෙසැම්බර් මස 24 දාතම හා අංක 671 දරන පිඹුරේ ලොට් 17 (පාර සඳහා වෙන්කිරීම) දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග වෙළුම/පත්‍රිරුව M 527/62 යටතේ ගම්පහ දැන් මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11 - 322

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. ඉසෙඩ්. එම්. ජකීන්
ගිණුම් අංකය : 0193 5000 1010

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.07.30 දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. නාගොඩවිතාන යන අය විසින් ලියා සහතික කරන ලද 2018 මාර්තු මස 29 දාතම හා අංක 2203 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොහමඩ් සහීම් මොහමඩ් ජකීන් බන්ධනදායි වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 2203 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එක් කෝටි හත් ලක්ෂ තිස් නව දහස් පන්සිය දෙකයි ශත අනූ දෙකක (රු. 10,739,502.92) මුදලක්, 2025 අප්‍රේල් මස 06 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක් කෝටි හත් ලක්ෂ තිස් නව දහස් පන්සිය දෙකයි ශත අනූ දෙකක (රු. 10,739,502.92) මුදල ද, 2025 අප්‍රේල් මස 07 දින සිට අංක 2203 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අනූ දෙලක්ෂ අසූ දහස් පන්සිය පහයි ශත අසූ අටක (රු. 9,280,505.88) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම බිංදුවක් (14.0%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 2203 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ කොළඹ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මාලිගාවත්ත ග්‍රාම නිලධාරි වසමේ, වෝඩ් අංක 14, (කළින් කොටහේන වෝඩ්), ග්‍රෑන්ඩ්පාස් දකුණ ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ දිගේ පිහිටි කොළඹ 14, ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ, වරිපනම් අංක 275-4/1 දරන සිව් වෙනි මහලේ පිහිටා ඇති බලයලත් මානක තැන කේ. කනගසිංහම් විසින් සාදන ලද 2012 ඔක්තෝබර් මස 16 දාතම හා අංක 2698 දරන සහාධිපත්‍ය සැළැස්මේ FOA වශයෙන් බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලකුණුකොට ඇති සහාධිපත්‍ය එපාර්ට්මන්ට් පාර්සල් කොටසට මායිම් :

*ඊසානට* : ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ වරිපනම් අංක 279 දරන පරිශ්‍රයන් සමග මෙම සහාධිපත්‍ය පාර්සල් කැබැල්ලේ බිත්තිය සහ මෙම සහාධිපත්‍ය පාර්සල් කැබැල්ල සහ CE5 හි විවෘත ඉඩකඩ අතර බිත්තියේ මැද;

*ගිණිකොණට* : මෙම සහාධිපත්‍ය පාර්සල් කැබැල්ල සහ CE6 හි විවෘත ඉඩකඩ අතර බිත්තියේ මැද;

*නිරිතට* : මෙම සහාධිපත්‍ය පාර්සල් කැබැල්ල සහ CE7 හි විවෘත ඉඩකඩ අතර බිත්තියේ මැද සහ පටුමග සමග මෙම සහාධිපත්‍ය පාර්සල් කැබැල්ලේ බිත්තිය;

*වයඹට* : මෙම සහාධිපත්‍ය පාර්සල් කැබැල්ල සහ සහාධිපත්‍ය පාර්සල් FOB, CE20 සහ CE4 හි විවෘත ඉඩකඩ අතර මෙම සහාධිපත්‍ය පාර්සල් කැබැල්ලේ බිත්තියේ මැද.

*යට අහස් මුදුන NADIR (Bottom)* : සහාධිපත්‍ය පාර්සල් TFA ට ඉහළින් මෙම සහාධිත්‍ය පාර්සල් කැබැල්ලේ කොන්ක්‍රීට් පොළොවේ මැද;

*ඉහළ අහස් මුදුන ZENITH (Top)* : සහාධිපත්‍ය පාර්සල් FIA ට ඉහළින් කොන්ක්‍රීට් පොළොවේ මැද.

වර්ග අඩි 1,400 ක් වන වර්ග මීටර් 130.06 Sq.m. ක බිම් පෙදෙසක් අඩංගුය.

මෙම සහාධිපත්‍ය පාර්සල් FOA කැබැල්ල සාලයකින්, කෑම කාමරයකින්, ප්‍රධාන නිදන කාමරයකින්, නිදන කාමර 2කින්, මුළුතැන් ගෙයකින්, ගබඩා කාමරයකින්, ඇඳුම් පැළඳුම් කාමරයකින්, සේවක වැසිකිළියකින්, වැසිකිළි 2කින් සහ බැල්කනිවලින් සමන්විතය.

මෙම සහාධිපත්‍ය පාර්සල් FOA හි සහාධිපත්‍ය දේපළ පොදු පහසුකම් හි නොබෙදු කොටස් අගය 5.56% කි.

සහාධිපත්‍ය පාර්සල් FOA සඳහා ආසන්නතම පොදු පිවිසුම් පෙදෙස CE20 වේ.

සහාධිපත්‍ය D 08/22 යටතේ කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

සහාධිපත්‍ය දේපළෙහි පොදු පහසුකම්

සහාධිපත්‍ය දේපළෙහි ව්‍යවස්ථාපිත පොදු අංග 1982 අංක 45 දරන (සංශෝධන) පනතේ 12 වැනි වගන්තිය සහ 2003 අංක 39 දරන මහල් නිවාස හිමිකාරත්වය නීතිය (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 1973 අංක 11 දරන මහල් නිවාස හිමිකාරත්ව නීතියේ 26 වැනි වගන්තියේ දක්වා ඇති පරිදිය :

1) ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම එයට අනුබද්ධ විවෘත අවකාශයන් ඇතුළත්ව සහාධිපත්‍ය දේපළ වේ.

2) ගොඩනැගිල්ලේ අත්තිවාරම් කුළුණු ගර්ඩර්ස් බාල්ක ආධාරක ප්‍රධාන බිත්ති සහ වහලය.

3) විදුලිය, දුරකථන, ගුවන්විදුලිය, නැවත පිරවීම, රූපවාහිනි, ජල නල, ජල ටැංකි, ජලය සඳහා සමීපය ඉහළින් පිහිටි ජල ටැංකි, පොම්පාගාරය නල මාර්ග, මලාපවහන මාර්ග, මැන්හෝල් සහ කසළ බැහැර කිරීම් වැනි මධ්‍යම සේවාවන් සඳහා ස්ථාපනයන්.

4) දේපළෙහි පැවැත්මට නඩත්තුවට ආරක්ෂාවට සහ සාමාන්‍යයෙන් පොදු භාවිතයට අවශ්‍ය හෝ පහසුවන දේපළෙහි අනෙකුත් සියලුම කොටස් සහ පහසුකම්.

ඉහත සඳහන් සහාධිපත්‍ය සැලැස්මේ පිටු අංක 3 සිට 19 දක්වා ඇති සහ විස්තර කර ඇති ප්‍රදේශවල පොදු මූලද්‍රව්‍ය අර්ථ දැක්වීම සහ විස්තර කිරීම.

CE 1- (*අ*) විවෘත අවකාශය වාතාශ්‍රය සඳහා වේ;
(*ආ*) වයඹ සීමාවේ පිටුපස විවෘත අවකාශය සහ ඉඩම;
(*ඇ*) මෙම ඉඩම සියළුම සහාධිපත්‍ය පාර්සල් සඳහා වාහන නවතා තබන ස්ථානයක් ලෙස භාවිත කිරීම සඳහා වේ.

CE 2 - (*අ*) ඊසාන සීමාවේ විවෘත අවකාශය සහ ඉඩම;
(*ආ*) විවෘත අවකාශය වාතාශ්‍රය සඳහා වේ;
(*ඇ*) මෙම ඉඩම සියළුම සහාධිපත්‍ය පාර්සල් සඳහා වාහන නවතා තබන ස්ථානයක් ලෙස භාවිතා කිරීම සඳහා වේ.

CE 3 - (අ) ඊසාන සීමාවේ විවෘත අවකාශය සහ ඉඩම;
(ආ) විවෘත අවකාශය වාතාශ්‍රය සඳහා වේ;
(ඇ) ඉඩම සියළුම සහාධිපත්‍ය පාර්සල්වල වාහන නවතා තැබීම පිණිස පොදු භාවිතය සඳහා වේ.

CE 4 - (අ) ඊසාන සීමාවේ විවෘත අවකාශය සහ ඉඩම;
(ආ) විවෘත අවකාශය වාතාශ්‍රය සඳහා වේ;
(ඇ) ඉඩම සියළුම සහාධිපත්‍ය පාර්සල්වල වාහන නවතා තැබීම පිණිස පොදු භාවිතය සඳහා වේ.

CE 5 - (අ) ඊසාන සීමාවේ විවෘත අවකාශය සහ ඉඩම;
(ආ) විවෘත අවකාශය වාතාශ්‍රය සඳහා වේ;
(ඇ) ඉඩම සියළුම සහාධිපත්‍ය පාර්සල්වල වාහන නවතා තැබීම පිණිස පොදු භාවිතය සඳහා වේ.

CE 6 - (අ) ගිණිකොණ සීමාවේ විවෘත අවකාශය සහ ඉඩම;
(ආ) විවෘත අවකාශය වාතාශ්‍රය සඳහා වේ;
(ඇ) ඉඩම සියළුම සහාධිපත්‍ය පාර්සල්වල පිවිසුමක් සහ වාහන නවතා තැබීම පිණිස පොදු භාවිතය සඳහා වේ.

CE 7 - (අ) වයඹ සීමාවේ විවෘත අවකාශය සහ ඉඩම;
(ආ) විවෘත අවකාශය වාතාශ්‍රය සඳහා වේ;
(ඇ) ඉඩම සියළුම සහාධිපත්‍ය පාර්සල්වල වාහන පදවාගෙන යාමේ මාර්ගයක් ලෙස පොදු භාවිතය සඳහා වේ.

CE 8 - (අ) වයඹ සීමාවේ විවෘත අවකාශය සහ ඉඩම;
(ආ) විවෘත අවකාශය වාතාශ්‍රය සඳහා වේ;
(ඇ) ඉඩම සියළුම සහාධිපත්‍ය පාර්සල්වල වාහන පදවාගෙන යාමේ මාර්ගයක් ලෙස පොදු භාවිතය සඳහා වේ.

CE 9 - (අ) වයඹ සීමාවේ විවෘත අවකාශය සහ ඉඩම;
(ආ) විවෘත අවකාශය වාතාශ්‍රය සඳහා වේ;
(ඇ) ඉඩම සියළුම සහාධිපත්‍ය පාර්සල්වල පොදු භාවිතය සඳහා වේ.

CE 10 - (අ) වයඹ සීමාවේ විවෘත අවකාශය සහ ඉඩම;
(ආ) විවෘත අවකාශය වාතාශ්‍රය සඳහා වේ;
(ඇ) ඉඩම සියළුම සහාධිපත්‍ය පාර්සල්වල වාහන පදවාගෙන යාමේ මාර්ගයක් ලෙස පොදු භාවිතය සඳහා වේ.

CE 11 - (අ) කසල භාජනයයි;
(ආ) පොදු භාවිතය සඳහා වේ;

CE 12 - (අ) කසල භාජනයයි;
(ආ) පොදු භාවිතය සඳහා වේ;

CE 13 - (අ) බිම් මහලේ ආවරණය කර ඇති පෙදෙසයි;
(ආ) මෙම ඉඩම සියළුම සහාධිපත්‍ය පාර්සල්වල වාහන පදවාගෙන යාමේ මාර්ගයක් ලෙස සහ වාහන නවතා තැබීම සඳහා පොදු භාවිතය සඳහා වේ.

CE 14 - (අ) බිම් මහලේ වැසිකිළියයි;
(ආ) පොදු භාවිතය සඳහා වේ;

CE 15 - (අ) සියළුම මහල් කරා ගමන් කරන විදුලි සෝපානයයි;
(ආ) පොදු භාවිතය සඳහා වේ;

CE 16 - (අ) සියළුම මහල් කරා දිවෙන පිටගැටපෙළයි;
(ආ) පොදු භාවිතය සඳහා වේ;

CE 17 - (අ) පළමු මහලේ ඇවිද යා හැකි මාර්ගයයි;
(ආ) පොදු භාවිතය සඳහා වේ;
(ඇ) සාහාධිපත්‍ය පාර්සල් FFA, FFB සහ FFC වලට ආසන්නතම පොදු පිවිසුම් පෙදෙසයි.

CE 18 - (අ) දෙවෙනි මහලේ ඇවිද යා හැකි මාර්ගයයි;
(ආ) පොදු භාවිතය සඳහා වේ;
(ඇ) සාහාධිපත්‍ය පාර්සල් SFA, SFB සහ SFC වලට ආසන්නතම පොදු පිවිසුම් පෙදෙසයි.

CE 19 - (අ) තෙවන මහලේ ඇවිද යා හැකි පෙදෙසයි;
(ආ) පොදු භාවිතය සඳහා වේ;
(ඇ) සාහාධිපත්‍ය පාර්සල් TFA, TFB සහ TFC වලට ආසන්නතම පොදු පිවිසුම් පෙදෙසයි.

CE 20 - (අ) සතරවන මහලේ ඇවිද යා හැකි පෙදෙසයි;
(ආ) පොදු භාවිතය සඳහා වේ;
(ඇ) සාහාධිපත්‍ය පාර්සල් FOA, FOB සහ FOC වලට ආසන්නතම පොදු පිවිසුම් පෙදෙසයි.

CE 21 - (අ) පස්වන මහලේ ඇවිද යා හැකි පෙදෙසයි;
(ආ) පොදු භාවිතය සඳහා වේ;
(ඇ) සාහාධිපත්‍ය පාර්සල් FIA, FIB සහ FIC වලට ආසන්නතම පොදු පිවිසුම් පෙදෙසයි.

CE 22 - (අ) සයවන මහලේ ඇවිද යා හැකි පෙදෙසයි;
(ආ) පොදු භාවිතය සඳහා වේ;
(ඇ) සාහාධිපත්‍ය පාර්සල් SXA, SXB සහ SXC වලට ආසන්නතම පොදු පිවිසුම් පෙදෙසයි.

CE 23 - (අ) රූෆ් ටෙරසයයි;
(ආ) පොදු භාවිතය සඳහා වේ;

එකී සහාධිපත්‍ය එපාර්ට්මන්ට් ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම පහතින් විස්තර වේ :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාවන් තුළ, වෝඩ් අංක 14 (කළින් කොටහේන වෝඩ්), ග්‍රෑන්ඩ්පාස් දකුණ ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ දිගේ පිහිටි ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ, වරිපනම් අංක 275, 275-1/1 සහ 275-1/1A දරන බලයලත් මානක තැන පී. සින්නතම්බි විසින් සාදන ලද 1991 ජුනි මස 01 දාතම හා අංක 3165 දරන සැළැස්මේ ලොට් 1 වශයෙන් බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ 279 සහ පරාක්‍රම පාර, වරිපනම් අංක 94 දරන පරිශ්‍රයන්; ගිණිකොනට : ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ; නිරිතට : පරාක්‍රම පාර, අංක 86, ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ, වරිපනම් අංක 271 දරන පරිශ්‍රයන්, පටුමග සහ වයඹට : පරාක්‍රම පාර, වරිපනම් අංක 90 දරන පරිශ්‍රයන් සහ තිස්ස ඇපා සෙනවිරත්නට අයත් ඉතිරි ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි තුනක් (පර්. 23) හෝ හෙක්ටයාර 0.0582 හෝ වර්ග මීටර් 582 විශාල ඉඩම් කොටස අංක 3165 දරන එකී පිඹුරේ හිමිකම් වෙළුම/ පත්ඉරුව A 849/197 දැන් A 1026/221 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ග්‍රෑන්ඩ්පාස් දකුණ, ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ දිගේ පිහිටි ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ, වරිපනම් අංක 275, 275-1/1, 275-1/2, 275-1/3, 275-2/1, 275-2/2, 275-2/3, 275-3/1, 275-3/2, 275-3/3, 275-4/1, 275-4/2, 275-4/3, 275-5/1, 275-5/2, 275-5/3, 275-6/1, 275-6/2, 275-6/3 දරන සහාධිපත්‍ය පාර්සල් එපාර්ට්මන්ට් දහ අටක් (18) ක් ඇති බලයලත් මානක තැන කේ. කනගසිංහම් විසින් සාදන ලද 2012 ඔක්තෝබර් මස 16 දාතම හා අංක 2698 දරන සහාධිපත්‍ය සැළැස්මේ සහාධිපත්‍ය දේපළ ලොට් 1 වශයෙන් වර්තමානයේ ලකුණුකොට ඇති බලයලත් මානක තැන පී. සින්නතම්බි විසින් සාදන ලද 1991 ජුනි මස 01 දාතම හා අංක 3165 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ 279 සහ පරාක්‍රම පාර, වරිපනම් අංක 94 දරන පරිශ්‍රයන්; ගිණිකොණට : ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ; නිරිතට : පරාක්‍රම පාර, අංක 86 ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ, වරිපනම් අංක G 271 දරන පරිශ්‍රයන්, පටුමග සහ වයඹට : පරාක්‍රම පාර, වරිපනම් අංක 90 සහ 94 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි තුනක් (පර්. 23) හෝ හෙක්ටයාර 0.058174 හෝ වර්ග මීටර 581 විශාල ඉඩම් කොටස අංක 2698 දරන එකී සහාධිපත්‍ය සැළැස්මට අනුව ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11 - 271

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින්, 1974 අංක 10 දරන පනතින් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2025.10.10 දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :-

01. ප්‍රසිද්ධ නොතාරිස් නදීෂා තරංගනී පතිනායක විසින් සහතික කරන ලද 2017.06.09 දිනැති අංක 3352 දරන උකස් බැඳුම්කරය අනුව රුපියල් 15,000,000.00 (රුපියල් එක් කෝටි පනස් ලක්ෂයක් පමණි) ස්ථිර අයිරාව මත 2025.09.03 දින දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් 29,701,987.44ක (රුපියල් දෙකෝටි අනූ හත් ලක්ෂ එක් දහස් නවසිය අසූ හතයි ශත හතළිස් හතරක් පමණි) මුදලක් ද වසරකට සියයට පහළොවයි දශම පහයි බින්දුව (15.50%) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, රුපියල් 102,710,563.00ක (රුපියල් දහ කෝටි විසි හත් ලක්ෂ දහ දහස් පන්සිය හැට තුනක් පමණි) ණය මාලාව මත 2025.09.03 දින දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් 245,665,830.23ක (රුපියල් විසි හතර කෝටි පනස් හය ලක්ෂ හැට පන් දහස් අටසිය තිහයි ශත විසි තුනක් පමණි) මුදලක් ද වසරකට සියයට දාහතරයි දශම හතයි පහ (14.75%) බැගින් 2025.09.04 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, අංක 265, ඩැම් වීදිය, කොළඹ 12, වර්තමානයේ අංක 181/25, වයිට් හවුස් ගාඩ්න්ස්, කොළඹ 10 හි ෂාහුල් හමීඩ් සාදිකීන්ගෙන් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

02. එකී 2017.06.09 දිනැති අංක 3352 දරන උකස් බැඳුම්කරය අනුව ස්ථිර අයිරාව මත රුපියල් 29,701,987.44ක (රුපියල් දෙකෝටි අනූ හත් ලක්ෂ එක් දහස් නවසිය අසූ හතයි ශත හතළිස් හතරක් පමණි) මුදලක් ද ණය මාලාව මත රුපියල් 245,665,830.23ක (රුපියල් විසි හතර කෝටි පනස් හය ලක්ෂ හැට පන් දහස් අටසිය තිහයි ශත විසි තුනක් පමණි) මුදලක් ද සමග 2025.09.04 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී පරිදි තවදුරටත් අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත උපලේඛනයන්හි විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර එම්. එච්. ටී. කරුණාරත්න හට එකී ලංකා බැංකු ආඥාපනතේ 19 වගන්තිය (397 අධිකාරය) සහ එහි සංශෝධන යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වගන්තිය යටතේ ද මෙම යෝජනාවේ දැන්වීම් පළකිරීම සඳහා ලංකා බැංකුවේ මරදාන ශාඛාවේ කළමනාකරුහට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභාවේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලුත්කඩේ - බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වෝඩ් අංක 17, අලුත්කඩේ - බටහිර කොළඹ 12, පීර් සාම්බු වීදියෙහි පිහිටා ඇති වර්තමානයේ පීර් සාම්බු වීදිය, වරිපනම් අංක 84 සහ 86 දරන ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් සාදන ලද 1996 ජූලි මස 10 දිනැති අංක 4770 දරන පිඹුරේ ලොට් A ලෙස සලකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් A, උතුරට : පීර් සාම්බු වීදිය, වරිපනම් අංක 90 සහ 90/1 සිට 90/7 දක්වා, ඕල්ඩ් මූර් වීදිය, වරිපනම් අංක 202, 204 සහ 206 සහ අලුත්කඩේ වීදිය, වරිපනම් අංක 62 දරන පරිශ්‍ර ද; නැගෙනහිරට : අලුත්කඩේ වීදිය, වරිපනම් අංක 62 සහ 64 සහ පීර් සාම්බු වීදිය, වරිපනම් අංක 82 දරන පරිශ්‍රය ද; දකුණට: පීර් සාම්බු වීදිය, වරිපනම් අංක 82 දරන පරිශ්‍රය ද; බස්නාහිරට : පීර් සාම්බු වීදිය, පීර් සාම්බු වීදිය, වරිපනම් අංක 90 සහ 90/1 සිට 90/7 දක්වා, ඕල්ඩ් මූර් වීදිය, වරිපනම් අංක 202, 204 සහ 206 සහ අලුත්කඩේ වීදිය, වරිපනම් අංක 62 දරන පරිශ්‍ර ද මායිම්ව පර්චස් තිස් හයයි දශම හයයි හයක (පර්. 36.66) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 189/46 යන කාණ්ඩයෙහි/පත්ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

එකී අංක 4770 දරන පිඹුරේ විස්තර කරන ලද එකී ලොට් A පහත ඉඩම්වල ඒකාබද්ධ කිරීමකි, එනම් :-

(1) එකී කොළඹ 12, පීර් සාම්බු වීදියෙහි පිහිටා ඇති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාතන් විසින් සාදන ලද 2008 දෙසැම්බර් මස 10 දිනැති අංක 5782 දරන පිඹුරේ ලොට් X ලෙස සළකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් X : උතුරට : පීර් සාම්බු වීදිය, අංක 86 දරන පරිශ්‍රය ද; නැගෙනහිරට : අලුත්කඩේ වීදිය, අංක 62 සහ 64 දරන පරිශ්‍රය ද; දකුණට : පීර් සාම්බු වීදිය, අංක 62 දරන පරිශ්‍ර ද; බස්නාහිරට : පීර් සාම්බු වීදිය ද මායිම්ව පර්චස් දහ නවයයි දශම අටයි පහක (පර්. 19.85) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 66/68 යන කාණ්ඩයෙහි ලියාපදිංචි කර ඇත.

එකී අංක 5782 දරන පිඹුරේ විස්තර කරන ලද එකී ලොට් X පහත ඉඩමේ නැවත මිනුමකි, එනම් :-

එකී කොළඹ - 12, පීර් සාම්බු වීදියෙහි පිහිටා ඇති බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1962 දෙසැම්බර් මස 17 දිනැති අංක 2484 දරන පිඹුරේ මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ ඉඩම : උතුරට : පීර් සාම්බු වීදිය, වරිපනම් අංක 86 දරන පරිශ්‍රය ද; නැගෙනහිරට : අලුත්කඩේ වීදිය, අංක 64 දරන පරිශ්‍රය ද; දකුණට : අංක ගාර්ඩන් 82 පරිශ්‍රය ද; බස්නාහිරට: පීර් සාම්බු වීදිය ද මායිම්ව පර්චස් දහ නවයයි දශම අටයි පහක (පර්. 19.85) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ සියලු දේ සමග වේ.

(2) එකී කොළඹ - 12, පීර් සාම්බු වීදියෙහි පිහිටා ඇති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් විසින් සාදන ලද 1996 නොවැම්බර් මස 21 දිනැති අංක 6685 දරන පිඹුරේ ලොට් A ලෙස සලකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් A : උතුරට : පීර් සාම්බු වීදිය, වරිපනම් අංක ගාර්ඩන් 90 සහ 90/1 සිට 90/7 දක්වා සහ පීර් සාම්බු වීදිය, ඕල්ඩ් මූර් වීදිය, වරිපනම් අංක 202, 204 සහ 206 සහ අලුත්කඩේ වීදිය, වරිපනම් අංක 62 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : අලුත්කඩේ වීදිය, වරිපනම් අංක 62 සහ 64 දරන පරිශ්‍ර ද; දකුණට : පීර් සාම්බු වීදිය, අංක 84 සහ අලුත්කඩේ වීදිය, වරිපනම් අංක 64 දරන පරිශ්‍රය ද; බස්නාහිරට : අංක 2100 දරන පිඹුරේ ලොට් 7A සහ ලොට් 1 ද මායිම්ව පර්චස් පහළොවයි දශම බිංදුවයි හතක (පර්. 15.07) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ සියලු සමග වේ.

එකී අංක 6685 දරන පිඹුරේ විස්තර කරන ලද එකී ලොට් A පහත ඉඩම්වල ඒකාබද්ධ කිරීමකි. එනම් :-

(A) එකී වෝඩ් අංක 17, අලුත්කඩේ - බටහිර කොළඹ 12, පීර් සාම්බු වීදියෙහි පිහිටා ඇති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. රෙක්ස් ෆොන්සේකා විසින් සාදන ලද 1993 ජූලි මස 21 දිනැති අංක 2100 දරන පිඹුරේ ලොට් 1 ලෙස සලකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 1 : උතුරට : වරිපනම් අංක ගාර්ඩන් 90 සහ 90/1 සිට 90/7 දක්වා දරන පරිශ්‍ර ද; නැගෙනහිරට : ලොට් 2 ද; දකුණට : ලොට් 7 (පාරට වෙන් කිරීම) ද; බස්නාහිරට : පීර් සාම්බු වීදිය ද මායිම්ව පර්චස් එකයි දශම බින්දුවයි හතරක (පර්. 1.04) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 58/75 යන කාණ්ඩයෙහි/පත් ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

(B) එකී වෝඩ් අංක 17, අලුත්කඩේ - බටහිර කොළඹ 12, පීර් සාම්බු වීදියෙහි පිහිටා ඇති ඉඩමේ, අංක 2100 දරන පිඹුරේ ලොට් 2 ලෙස සළකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 2 : උතුරට : වරිපනම් අංක ගාර්ඩන් 90 සහ 90/1 සිට 90/7 දක්වා දරන පරිශ්‍ර ද; නැගෙනහිරට: ලොට් 3 ද; දකුණට : ලොට් 7 (පාරට වෙන් කිරීම) ද; බස්නාහිරට: ලොට් 1 ද මායිම්ව පර්චස් දෙකයි දශම පහයි පහක (පර්. 2.55) බිම් ප්‍රමාණයකින්

යුක්ත ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 868/86 යන කාණ්ඩයෙහි/ පත් ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

(C) එකී වෝඩ් අංක 17, අලුත්කඩේ - බටහිර කොළඹ 12, පීර් සාම්බු වීදියෙහි පිහිටා ඇති ඉඩමේ, අංක 2100 දරන පිඹුරේ ලොට් 3 ලෙස සළකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 3 : උතුරට : වරිපනම් අංක 90 සහ 90/1 සිට 90/7 දක්වා දරන පරිශ්‍ර ද; නැගෙනහිරට : ලොට් 4 ද; දකුණට : ලොට් 7 (පාර) ද; බස්නාහිරට : ලොට් 2 ද මායිම්ව පර්චස් දෙකයි දශම හතරයි අටක (පර්. 2.48) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 868/87 යන කාණ්ඩයෙහි/පත් ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

(D) එකී වෝඩ් අංක 17, අලුත්කඩේ - බටහිර කොළඹ 12, පීර් සාම්බු වීදියෙහි පිහිටා ඇති ඉඩමේ, අංක 2100 දරන පිඹුරේ ලොට් 4 ලෙස සළකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 4 : උතුරට : වරිපනම් අංක 90 සහ 90/1 සිට 90/7 දක්වා සහ ඕල්ඩ් මූර් වීදිය 202 දරන පරිශ්‍රය ද; නැගෙනහිරට : ලොට් 5 ද; දකුණට : ලොට් 7 (පාර) ද; බස්නාහිරට : ලොට් 3 ද මායිම්ව පර්චස් එකයි දශම තුනයි දෙකක (පර්. 1.32) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 868/88 යන කාණ්ඩයෙහි/ පත් ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

(E) එකී වෝඩ් අංක 17, අලුත්කඩේ - බටහිර කොළඹ 12, පීර් සාම්බු වීදියෙහි පිහිටා ඇති ඉඩමේ, අංක 2100 දරන පිඹුරේ ලොට් 5 ලෙස සළකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 5 : උතුරට : ඕල්ඩ් මූර් වීදිය, වරිපනම් අංක 202 සහ 204 දරන පරිශ්‍ර ද; නැගෙනහිරට : ලොට් 6 ද; දකුණට : ලොට් 7 (පාර) ද; බස්නාහිරට : ලොට් 4 ද මායිම්ව පර්චස් එකයි දශම තුනයි දෙකක (පර්. 1.32) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 868/89 යන කාණ්ඩයෙහි/පත් ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

එකී වෝඩ් අංක 17, අලුත්කඩේ - බටහිර, කොළඹ - 12, පීර් සාම්බු වීදියෙහි පිහිටා ඇති ඉඩමේ අංක 2100 දරන පිඹුරේ ලොට් 6 ලෙස සලකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 6: උතුරට : ඕල්ඩ් මූර් වීදිය, වරිපනම් අංක 204 සහ 206 සහ අලුත්කඩේ වීදිය, වරිපනම් අංක 62 දරන පරිශ්‍ර ද; නැගෙනහිරට : අලුත්කඩේ වීදිය, වරිපනම් අංක 62, 64 දරන පරිශ්‍ර ද; දකුණට : ලොට් 7 (පාර) ද; බස්නාහිරට: ලොට් 5 ද මායිම්ව පර්චස් එකයි දශම තුනයි දෙකක (පර්. 1.32) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 868/90 යන කාණ්ඩයෙහි/පත් ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

(3) එකී වෝඩ් අංක 17, අලුත්කඩේ - බටහිර, කොළඹ - 12, පීර් සාම්බු වීදියෙහි පිහිටා ඇති ඉඩමේ, අංක 2100 දරන පිඹුරේ ලොට් 7 ලෙස සළකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 7 : උතුරට : ලොට් 1 සහ ලොට් 6 ද; නැගෙනහිරට : අලුත්කඩේ වීදිය, වරිපනම් අංක 64 දරන පරිශ්‍රය ද; දකුණට : වරිපනම් අංක 84 දරන පරිශ්‍රය ද; බස්නාහිරට : පීර් සාම්බු වීදිය ද මායිම්ව පර්චස් හයයි දශම හතයි අටක (පර්. 6.78) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 868/85 යන කාණ්ඩයෙහි/පත්ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. බී. ඒ. අයි. දිසානායක,
කළමනාකරු.

ලංකා බැංකුව,
මරදාන ශාඛාව.

11-281

---

**ලංකා බැංකුව**

## 1968 අංක 34 දරන පනතින්, 1974 අංක 10 දරන පනතින් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2025.10.10 දින පවත්නන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජී. විජේසිංහ විසින් සහතික කරන ලද 2012.05.21 දිනැති අංක 125 දරන උකස් බැඳුම්කරය හා 2013.05.07 දිනැති අංක 711 දරන උකස් බැඳුම්කරය අනුව රුපියල් 11,043,197.64ක (රුපියල් එක් කෝටි දස ලක්ෂ හතළිස් තුන් දහස් එකසිය අනූ හතයි ශත හැට හතරක් පමණි) 1 වන ණය මත 2025.09.10 දින දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් 15,962,738.70ක (රුපියල් එක් කෝටි පනස් නව ලක්ෂ

හැට දෙදහස් හත්සිය තිස් අටයි ශත හැත්තෑවක් පමණි) මුදලක් ද වසරකට සියයට දහසය (16%) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, රුපියල් 2,767,712.80ක (රුපියල් විසි හත් ලක්ෂ හැට හත් දහස් හත්සිය දොළහයි ශත අසූවක් පමණි) 2 වන ණය මත 2025.09.10 දින දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් 3,311,520.76ක (රුපියල් තිස් තුන් ලක්ෂ එකොළොස් දහස් පන්සිය විස්සයි ශත හැත්තෑ හයක් පමණි) මුදලක් ද වසරකට සියයට හත (7%) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, රුපියල් 1,860,538.55ක (රුපියල් දහ අට ලක්ෂ හැට දහස් පන්සිය තිස් අටයි ශත පනස් පහක් පමණි) 3 වන ණය මත 2025.09.10 දින දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් 2,754,891.28ක (රුපියල් විසි හත් ලක්ෂ පනස් හතර දහස් අටසිය අනූ එකයි ශත විසි අටක් පමණි) මුදලක් ද වසරකට සියයට පහළොවයි දශම පහ (15.5%) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, රුපියල් 362,119.51ක (රුපියල් තුන් ලක්ෂ හැට දෙදහස් එකසිය දහ නවයයි ශත පනස් එකක් පමණි) 4 වන ණය මත 2025.09.10 දින දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් 461,851.20ක (රුපියල් හාර ලක්ෂ හැට එක් දහස් අටසිය පනස් එකයි ශත විස්සක් පමණි) මුදලක් ද වසරකට සියයට පහළොවයි දශම පහ (15.5%) බැගින් 2025.09.11 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, බත්තරමුල්ල, රොබට් ගුණවර්ධන මාවත, අංක 186 හි අලි අස්ගර් ෂබ්බීර් හුසේන් අබ්බාස් මහතාගේ ලංකා බැංකුවට අය විය යුතුව ඇත.

02. එකී 2012.05.21 දිනැති අංක 125 දරන උකස් බැඳුම්කරය සහ 2013.05.07 දිනැති අංක 711 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය මත රුපියල් 15,962,738.70ක (රුපියල් එක් කෝටි පනස් නව ලක්ෂ හැට දෙදහස් හත්සිය තිස් අටයි ශත හැත්තෑවක් පමණි) මුදලක් ද 2 වන ණය මත රුපියල් 3,311,520.76ක (රුපියල් තිස් තුන් ලක්ෂ එකොළොස් දහස් පන්සිය විස්සයි ශත හැත්තෑ හයක් පමණි) මුදලක් ද 3 වන ණය මත රුපියල් 2,754,891.28ක (රුපියල් විසි හත් ලක්ෂ පනස් හතර දහස් අටසිය අනූ එකයි ශත විසි අටක් පමණි) මුදලක් ද, 4 වන ණය මත රුපියල් 461,851.20ක (රුපියල් හාර ලක්ෂ හැට එක් දහස් අටසිය පනස් එකයි ශත විස්සක් පමණි) මුදලක් ද සමග 2025.09.11 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී පරිදි තවදුරටත් අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වගන්තිය යටතේ අය කර ගත හැකි ගාස්තු හා මුදල් ද අය කර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත උපලේඛනයන්හි විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3, ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර එම්. එච්. ටී. කරුණාරත්න හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වගන්තිය සහ එහි සංශෝධන යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වගන්තිය යටතේ ද මෙම යෝජනාවේ දැන්වීම් පළකිරීම සඳහා ලංකා බැංකුවේ විශාඛා ශාඛාවේ කළමනාකරුහට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, 479E, බටපොත ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ, රොබට් ගුණවර්ධන මාවතෙහි, වරිපනම් අංක 184 දරන "නාරංගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 2010 දෙසැම්බර් මස 2 දිනැති අංක 11372 දරන පිඹුරේ ලොට් A ලෙස සලකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් A : උතුරට : රොබට් ගුණවර්ධන මාවත ද; නැගෙනහිරට : ජී. සී. පෙරියප්පෙරුමගේ ඉඩම ද; දකුණට : රොබට් ගුණවර්ධන මාවත, වරිපනම් අංක 84/2 දරන පරිශ්‍රය සහ බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන විසින් සාදන ලද අංක 1364 දරන පිඹුරේ ලොට් 1 ද; බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන විසින් සාදන ලද අංක 1364 දරන පිඹුරේ ලොට් 1 සහ රොබට් ගුණවර්ධන මාවත, වරිපනම් අංක 186 දරන පරිශ්‍ර ද මායිම්ව එකී අංක 11372 දරන පිඹුර අනුව පර්චස් තිස් තුනයි දශම දෙකයි බිංදුවක (පර්. 33.20) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම කඩුවෙල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 1438/30 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම පහත විස්තර කෙරෙන ඉඩමේ නැවත මිනුමක් වන ඒකාබද්ධ කිරීමකි :-

(1) එකී රොබට් ගුණවර්ධන මාවත, වරිපනම් අංක 184/1 (කොටස) දරන "නාරංගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන විසින් සාදන ලද 1983 මාර්තු මස 1 දිනැති අංක 1364 දරන පිඹුරේ ලොට් D ලෙස සලකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් D : උතුරට : රොබට් ගුණවර්ධන මාවත ද; නැගෙනහිරට : අඩි පාර ද; දකුණට : නලවත්තගේ ජෝර්ජ් පින්ටෝගේ ඉඩම දැන් ඩී. ජී. සුමිත්‍රාආරච්චිගේ දේපළ ද; බස්නාහිරට : ලොට් C ද මායිම්ව එකී අංක 1364 දරන පිඹුර අනුව පර්චස් විසි දෙකයි දශම දෙකයි පහක (පර්. 22.25) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 265/49 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම පහත විස්තර කෙරෙන ඉඩමේ නැවත මිනුමකි :

"නාරංගහවත්තෙ" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. එන්. ජයවර්ධන විසින් සාදන ලද 1992.08.29 දිනැති අංක 444 දරන පිඹුරේ ලොට් 1 ලෙස සළකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 1 : උතුරට : රොබට් ගුණවර්ධන මාවත ද; නැගෙනහිරට : අඩි 6ක් පළලැති අඩි පාර ද;

දකුණට : රොබට් ගුණවර්ධන මාවත, වරිපනම් අංක 94/2 දරන වික්ටර් පෙරේරාගේ ඉඩම ද; බස්නාහිරට : රොබට් ගුණවර්ධන මාවත, වරිපනම් අංක 76 ද මායිම්ව පර්චස් විසි දෙකක (පර්. 22) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලු දේ සමඟ වේ.

(1) රොබට් ගුණවර්ධන මාවත, වරිපනම් අංක 184A දරන "නාරංගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු සී.ද එස්. ගුණතිලක විසින් සාදන ලද 1997 අප්‍රේල් මස 23 දිනැති අංක 2584 දරන පිඹුරේ ලොට් 2 ලෙස සලකුණු කර මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 2 : උතුරට : රොබට් ගුණවර්ධන මාවත ද; නැගෙනහිරට : රොබට් ගුණවර්ධන මාවත, වරිපනම් අංක 186 ද; දකුණට : ලොට් 1 ද; බස්නාහිරට: ලොට් 1 ද මායිම්ව එකී අංක 2584 දරන පිඹුර අනුව පර්චස් දහයක (පර්. 10) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලු දේ සමඟ වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1162/130හි ලියාපදිංචි කර ඇත.

ජේ. එම්. එස්. ජේ. වීරසිංහ මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
විශාඛා ශාඛාව.

11-280

---

**කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී - මහනුවර ශාඛාව**
**(මින් පෙර, කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙ හි 4 වගන්තිය යටතේ, බැංකුවෙ හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය

ගනුදෙණුකරුවන්ගේ නම් : ගොස්සිනා බඳුගේ අමල් ප්‍රියංකර සහ ජයවික්‍රම ආරච්චිලාගේ චන්දිමා මල්කාන්ති ගුණතිලක.

ලියාපදිංචි අංක PQ00293614 දරන (මින් පෙර ලියාපදිංචි අංක PB 4847 දරන කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් වශයෙන් හැඳින්වුණු) කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී (මෙහි මින්මතු ඇතැම් තැනක "බැංකුව" යනුවෙන් හැඳන්වෙන) හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.07.11 දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් හා ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

කොළඹ 3, ගාලු පාර, අංක 696 යන ස්ථානයෙහි සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන සහ ලියාපදිංචි අංක PQ00293614 දරන (මින් පෙර ලියාපදිංචි අංක PB 4847 දරන කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් වශයෙන් හැඳින්වුණු) කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී (මෙහි මින්මතු ඇතැම් තැනක "බැංකුව" යනුවෙන් හැඳින්වෙන) වෙනුවෙන්, ආර්. ජේ. ඒ. වත්සලා කුමාරි හේරත්, ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද උකස්කර දෙක වන 2020.02.28 දිනැති අංක 6482 දරන උකස්කරය සහ 2023.09.20 දිනැති අංක 7843 දරන උකස්කරය මගින් උකස්කර සහ ඇපයට තබා ඇති සහ මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ සුරක්ෂිතයක් වශයෙන් තබා, ඊට එරෙහිව ප්‍රදානය කරන ලද මූල්‍ය පහසුකම් ආපසු ගෙවීම, ණය ගැණුම්කරු/ උකස්කරු වශයෙන් ගොස්සිනා බඳුගේ අමල් ප්‍රියංකර විසින් පැහැර හැර ඇති බැවින්,

සහ 2024.03.31 දින වනවිට රුපියල් හතළිස් නව ලක්ෂ පනස් හතර දහස් නවසිය දාහතයි ශත විසිහතරක (රු. 4,954,917.24) මුදලක්,

2024.04.01 දින සිට රු. 92,230,374.49 මත වාර්ෂිකව 19.5%ක අනුපාතිකයට පොළිය ද සමග 2024.03.31 දින වන විට රුපියල් දසකෝටි හැටහය ලක්ෂ හතළිස් පන්දහස් තුන්සිය හතයි ශත හැත්තෑපහක (රු. 106,645,307.75) මුදලක් බැංකුව වෙත ගෙවිය යුතුව, ණය ව පවතින බැවින් ද,

එකී අංක 6482 සහ 7843 දරන උකස්කර මත ප්‍රදානය කරන ලද මූල්‍ය පහසුකම් සහ/හෝ මුල් මුදල සහ පොළිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රදානය කරන ලද සහන කාලය අදාළව, සම්පූර්ණ ගෙවීම සිදු කරන තෙක් 2024.04.01 දින සිට රු. 5,320,023.59 මත වාර්ෂිකව 17.50%ක අනුපාතිකයට පොළිය ද සමග 2024.03.31 වන විට රුපියල් හැටඑක් ලක්ෂ පනස් පන්දහස් හයසිය හැත්තෑවයි ශත පනස්හතක (රු. 6,155,670.57) මුදලක් ගෙවිය යුතුව පවතින බැවින් ද;

බැංකුව වෙනුවෙන් ආර්. ජේ. ඒ. වත්සලා කුමාරි හේරත්, ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද උකස්කර දෙක වන 2021.04.23 දිනැති අංක 7089 දරන උකස්කරය සහ 2023.09.20 දිනැති අංක 7845 දරන උකස්කරය මගින් උකස්කර සහ ඇපයට තබා ඇති සහ මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ සුරක්ෂිතයක් වශයෙන් තබා, ඊට එරෙහිව ප්‍රදානය කරන ලද මූල්‍ය පහසුකම් ආපසු ගෙවීම, ණය ගැණුම්කරු/ උකස්කරු වශයෙන් ගොස්සිනා බඳුගේ අමල් ප්‍රියංකර විසින් සහ ණය ගැණුම්කරු වශයෙන් ජයවික්‍රම ආරච්චිලාගේ චන්දිමා මල්කාන්ති ගුණතිලක විසින් පැහැර හැර ඇති බැවින්,

සහ මේ වනවිට, පහත පරිදි බැංකුව වෙත ගෙවිය යුතුව, ණය ව පවතින බැවින් ද,

2024.04.01 දින සිට රු. 48,069,849.54 මත වාර්ෂිකව 19.5% ක අනුපාතිකයට පොළිය ද සමග 2024.03.31 දින වන විට රුපියල් පන්කෝටි පනස්පන් ලක්ෂ හැටඅට දහස් හාරසිය හැත්තෑ එකයි ශත හැට නවයක (රු. 55,568,471.69) මුදලක්,

2024.04.01 දින සිට රු. 2,804,164.70 මත වාර්ෂිකව 17.50% ක අනුපාතිකයට පොලිය ද සමග 2024.03.31 දින වන විට රුපියල් තිස්දෙලක්ෂ හතළිස් හතර දහස් තුන්සිය තිස් එකයි ශත හතළිස් පහක (රු. 3,244,331.45)ක මුදලක්,

එකී අංක 7089 සහ 7845 දරන උකස්කර මත ප්‍රදානය කරන ලද මූල්‍ය පහසුකම් අදාළව, සම්පූර්ණ ගෙවීම සිදු කරන තෙක් 2024.04.01 දින සිට රු. 2,832,370.31 මත වාර්ෂිකව 17.50%ක අනුපාතිකයට පොලිය ද සමග 2024.03.31 වන විට රුපියල් තිස්දෙලක්ෂ හැත්තෑ හය දහස් හැත්තෑවයි ශත විසිහතක (රු. 3,276,070.27)ක මුදලක් ගෙවිය යුතුව පවතින බැවින් ද;

මෙමගින් පහත පරිදි සම්මත කරගන්නා ලදී :-

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත හි 4 වන වගන්තිය ප්‍රකාර, කොළොන්නාව, විහාර මාවත, අංක 182/3(50/3) හි බලපත්‍රලාභී වෙන්දේසිකරු, තුසිත් කරුණාරත්න හට, ණය ගැනුම්කරු/ උකස්කරු වශයෙන් ගොස්සිනා බදුගේ අමල් ප්‍රියංකර විසින් ණය ගැනුම්කරු වශයෙන් ජයවික්‍රම ආරච්චිලාගේ චන්දිමා මල්කාන්ති ගුණතිලක විසින් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තරාත්මකව විස්තර කර ඇති අංක 6482, 7843, 7089 සහ 7845 දරන උකස්කර මගින් උකස් කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලය පවරන අතර, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙ හි 13 වන වගන්තිය යටතේ, අය කරගනු ලැබිය හැකි මුදල් සහ ඒ මත ලැබිය යුතු පොලිය සමග එකී රුපියල් දහහත් කෝටි අනූඅට ලක්ෂ හතළිස් හතර දහස් හත්සිය හැටඅටයි ශත අනූහතක (රු. 179,844,768.97) මුදල සමග උකසට තබන ලද දේපළ සම්බන්ධයෙන් සහ ඉහත කී දිනයන් හි සිට විකුණුම් දින දක්වා ඒ මත ලැබිය යුතු පොලිය සහ ලැබුණු දින සිට ගෙවීම් (වේ නම්) අඩු කර, අයකර ගත හැකි පිරිවැය සහ අයකර ගත හැකි මුදල් අයකර ගැනීමට;

## උපලේඛනය

(1) මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔයපාත කෝරළේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුවරඑළිය මහනගර සභා සීමාව තුළ හාවාඑළිය ග්‍රාම සේවා වසමේ, 535D, නුවරඑළිය මධ්‍යම පිහිටි සඳතැන්න පාර, වරිපනම් අංක 38 දරන, "මහගස්තොට වතුයාය සඳතැන්න කොටස" දරන ඉඩමට බලයලත් මිනින්දෝරු නිමල් ලියනගේ මහතා විසින් මැන සාදන ලද අංක 1722 හා 2017 ජනවාරි මස 11 සහ 09 දින දරන පිඹුරේ කැබලි අංක 2 දරන කොටසට මායිම් : උතුරට : අංක 1722 දරන පිඹුරේ කැබලි අංක 4 (පාර), අංක 08/117 දරන පිඹුරේ කැබලි අංක 1, සුනිල් එදිරිවීර හිමිකම් කියන ඉඩම සහ නැගෙනහිරට : අංක 08/117 දරන පිඹුරේ කැබලි අංක 1, සුනිල් එදිරිවීර හිමිකම් කියන ඉඩම, අශෝකාරාම පන්සල් භූමිය, නෙස්බි (තේ) වතුයාය සහ දකුණට : නෙස්බි (තේ) වතුයාය සහ අංක 1722 දරන පිඹුරේ කැබලි අංක 3 සහ බස්නාහිරට : කැබලි අංක 3 සහ කැබලි අංක 4 (පාර) යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකයි පර්චස් විසි හතයි දශම හතරයි බිංදුව (අ.1, පර්. 27.40)ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, බිම, ගහකොළ, පළතුරු ඇතුළු අංක 1722 දරන පිඹුරේ සඳහන් සියලු දේ වේ. මෙය නුවරඑළිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම/ පත්ඉරුව A202/124 හි ලියාපදිංචි වී ඇත.

(2) මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔයපාත කෝරළේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුවරඑළිය මහනගර සභා සීමාව තුළ හාවාඑළිය ග්‍රාම සේවා වසමේ, 535D, නුවරඑළිය මධ්‍යම පිහිටි සඳතැන්න පාර, වරිපනම් අංක 38/2 දරන, "මහගස්තොට වතුයාය සඳතැන්න කොටස" දරන ඉඩමට බලයලත් මිනින්දෝරු නිමල් ලියනගේ විසින් මැන සාදන ලද අංක 1722 හා 2017 ජනවාරි මස 11 සහ 09 දින දරන පිඹුරේ කැබලි අංක 3 දරන කොටසට මායිම් : උතුරට : අංක 1733 දරන පිඹුරේ කැබලි අංක 1, කැබලි අංක 4 (පාර) සහ කැබලි අංක 2; නැගෙනහිරට : කැබලි අංක 2 සහ නෙස්බි වතුයාය; දකුණට : නෙස්බි වතුයාය සහ බස්නාහිරට : නෙස්බි වතුයාය, අංක 1733 දරන පිඹුරේ කැබලි අංක 1 සහ කැබලි අංක 4 (පාර) යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකයි පර්චස් විසි හතයි දශම හතරයි බිංදුව (අ.1, පර්. 27.40)ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, බිම, ගහකොළ, පළතුරු ඇතුළු අංක 1722 දරන පිඹුරේ සඳහන් සියලු දේ වේ. මෙය නුවරඑළිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව A202/125 හි ලියාපදිංචි වී ඇත.

පහත සඳහන් ඉඩම් කොටසේ මාර්ග ප්‍රවේශය ද සමග.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔයපාත කෝරළේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුවරඑළිය මහනගර සභා සීමාව තුළ හාවාඑළිය ග්‍රාම සේවා වසමේ, 535D, නුවරඑළිය මධ්‍යම පිහිටි සඳතැන්න පාර, වරිපනම් අංක 38/2 දරන, "මහගස්තොට වතුයාය සඳතැන්න කොටස" දරන ඉඩමට බලයලත් මිනින්දෝරු නිමල් ලියනගේ විසින් මැන සාදන ලද අංක 1722 හා 2017 ජනවාරි මස 11 සහ 09 දින දරන පිඹුරේ කැබලි අංක 4 (පාර සඳහා වෙන්කරන ලද) දරන කොටසට මායිම් : උතුරට : අංක 1733 දරන පිඹුරේ කැබලි අංක 1, අංක 974N දරන පිඹුරේ කැබලි අංක 1, කැබලි අංක 1A සහ කැබලි අංක 1 සහ සඳතැන්න පාර; නැගෙනහිරට: සඳතැන්න පාර, පිඹුරු අංක 1102N, 08/29A සහ 08/117, කැබලි අංක 2 සහ 3, දකුණට : කැබලි අංක 2, 3 සහ අංක 1733 දරන පිඹුරේ කැබලි අංක 1; බස්නාහිරට: අංක 1733 දරන පිඹුරේ කැබලි අංක 1 සහ කැබලි අංක 1 යන මෙකී

මායිම් තුළ පිහිටි පර්චස් තිස් අටයි දශම පහයි දෙකක් (පර්. 38.52) විශාල අංක 1722 දරන පිඹුරේ සඳහන් ඉඩම. මෙය නුවරඑළිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම/ පත්ඉරුව A 202/20 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

චමිලා අබේසූරිය,
ප්‍රධානි ණය අයකර ගැනීම්.

11-312

---

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.**

සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 7 වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනා සම්මතයයි

2025 ජූලි මස 21 දින පැවති නැෂනල් ඩිවලප්මන්ට් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී පහත සඳහන් වන යෝජනා සම්මතය විශේෂිතවම සහ ඒකමතිකව සම්මත කරනු ලැබිය. එනම්,

කෑගල්ල, සිද්ධාර්ථ මාවත, අංක 26/4 දරන ස්ථානයේ පදිංචි ඇල්ගිරිය ගමගේ දයාන් සනීර ප්‍රසාද් කුලරත්න (ණයකරු) විසින් නැෂනල් ඩිවලප්මන්ට් බැන්ක් පී.එල්.සී. (බැංකුව) හි නමින් ලියා සකස් කළ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් සමරක්කොඩි මුදියන්සේලාගේ හසිනි උපුලිකා කුමාරසිංහ විසින් ලියා සහතික කළ 2019.01.09 දිනැති අංක 431 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කර උකසට යටත් කරනු ලැබූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර වන දේපළ සහ පරිශ්‍රය සුරැකුම මත පිරිනමන ලද ණය මුදල/ පහසුකම මත වූ ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

ණය ගැණුම්කරු, මෙහි පහත විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයේ සින්නක්කර හිමිකරු වශයෙන් අංක 431 දරන එකී බැඳුම්කරය යටතේ බැංකුව වෙත ඔහුගේ සින්නකර අයිතිය, හිමිකම සහ බැඳියාව උකස් කර ඇති හෙයින් ද,

2025 අප්‍රේල් මස 30 දිනට රුපියල් දොළොස් මිලියන හැත්තෑ තුන් දහස් දෙසිය හතළිස් අටයි ශත පනස් අටක (රු. 12,073,248.58) මුදලක් අංක 431 දරන එකී බැඳුම්කරය මත බැංකුව වෙත අය විය යුතුව සහ ලැබිය යුතු බවට පත්ව ඇති හෙයින් ද,

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ තමන් වෙත පැවරී ඇති බලතල යටතේ කටයුතු කරමින් රුපියල් දොළොස් මිලියන හැත්තෑ තුන් දහස් දෙසිය හතළිස් අටයි ශත පනස් අටක (රු. 12,073,248.58) එකී මුදල හෝ විකුණන අවස්ථාවේ දී නොගෙවා ඉතිරිව පවතින එහි ඕනෑම කොටසක් සහ අයවිය යුතු අංක 431 දරන එකී බැඳුම්කරය මගින් සුරැකුම් කළ සහ 2025 මැයි මස 1 දින සිට විකිණීමේ දිනය දක්වා වාර්ෂිකව සියයට දහතුනයි දශම හතරයි පහ (13.45%) බැගින් එකී බැඳුම්කරය මත රුපියල් නව මිලියන අටසිය පනස් දහසක (රු. 9,850,000.00) ප්‍රාග්ධන මුදල මත පොළිය ද, ප්‍රචාරණ සහ විකිණීමේ පිරිවැය ද සහ ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව උද්ගත වූ වෙනත් ගාස්තු ද සමග ඉන් අනතුරුව යම් ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා එකී බැඳුම්කරය මගින් එකී ණය මුදල/පහසුකම සඳහා සුරැකුම් වශයෙන් බැංකුව වෙත උකස් කළ පහත විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයට ඇති සින්නක්කර සහ අනෙකුත් අයිතිය, හිමිකම සහ බැඳියාව ද ඇතුළුව දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු නිශාන්ත උපුල් ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**පළමු උපලේඛනය**
**(ඉඩම සහ පරිශ්‍රය පිළිබඳ විස්තරය)**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, උඩුගහ පත්තුවෙහි, සීතාවක නගර සභා සීමා තුළ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 432 බී, සීතාවක ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි, අවිස්සාවේල්ල පාර, යටියන්තොට පිහිටි "දෙළුම්ගහ වත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. වෙළගෙදර විසින් සකස් කළ 2007.04.25 දිනැති අංක 4101 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 1 කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්,

*උතුරට* : අංක 4101 දරන එකී පිඹුරේ ලොට් 5 කැබැල්ල ද;

*නැගෙනහිරට* : නිමල් විජේසේන හිමිකම්පාන හි.පි. 977165 හි නිරූපිත ඉඩම ද;

*දකුණට* : ලීලාරත්න විජේසිංහට කලින් අයිතිව තිබූ මිල්ලගහ කුඹුර *හෙවත්* කෝන්ගහ කුඹුර ද;

*බටහිරට* : ප්‍රවේශ මාර්ගය ද.

යන මායිම් තුළ පිහිටි පර්චස් හතයි දශම හයයි අටයි පහක (පර්. 7.685) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සහ එකී පිඹුරේ නිරූපිත මාර්ගයන් පොදුවේ භාවිත කර නඩත්තු කිරීමේ අයිතිය ද සමග.

අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව B247/29 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලප්මන්ට් බැන්ක් පී.එල්.සී.

11-285

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - බත්තරමුල්ල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණයදෙනුකරුවන්ගේ නම් :අප්පුහැන්නදි තොටහේවගේ ආරියපාල සහ පලිපාන ගැවිලිපිටියගේ මාලනී ආරියපාල

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2025ක් වූ ජුනි මස 26 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, ඉහත කී අප්පුහැන්නදි තොටහේවගේ ආරියපාල සහ පලිපාන ගැවිලිපිටියගේ මාලනී ආරියපාල යන අය "බන්ධනදායින්/ උකස්කරුවන්" ලෙස ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. එන්. චන්දිමා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.09.30 දිනැති අංක 259 දරන ප්‍රාථමික උකස්කරය, වර්ෂ 2017.08.28 දිනැති අංක 599 දරන ද්විතීයික උකස්කරය සහ වර්ෂ 2018.02.09 දිනැති අංක 691 දරන තෘතීයික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 259, 599 සහ 691 දරන උකස්කරයන් මත,

1. වර්ෂ 2025.05.13 දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් තුන්සිය හැට පන් ලක්ෂ අසූ හය දහස් හාරසිය දාහතරයි ශත දාහතර (රු. 36,586,414.14) ක මුදලක් ද, වර්ෂ 2025.05.14 දින සිට රුපියල් දෙසිය විසි තුන් ලක්ෂ විසි හතර දහස් හාරසිය පහයි ශත හතළිස් හය (රු. 22,324,405.46)ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 22%ක පොළිය ද;

2. වර්ෂ 2025.05.13 දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් එකසිය අනූ ලක්ෂ හතළිස් හතර දහස් පන්සිය පනස් එකයි ශත තිස් හතර (රු. 19,044,551.34) ක මුදලක් ද, වර්ෂ 2025.05.14 දින සිට රුපියල් එකසිය තිස් ලක්ෂ අනූ එක් දහස් පන්සිය පනස් හතරයි ශත හතළිස් හතර (රු. 13,091,554.44) ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 22%ක පොළිය ද;

3. වර්ෂ 2025.05.13 දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් තුන්සිය පනස් ලක්ෂ හැත්තෑ එක් දහස් නවසිය අසූ දෙකයි ශත අනූ අට (රු. 35,071,982.98) ක මුදලක් ද, වර්ෂ 2025.05.14 දින සිට රුපියල් දෙසිය හය ලක්ෂ හැට හතර දහස් දෙසිය දාසයයි ශත පනස් හතර (රු. 20,664,216.54) දක්වා වූ මුදල මත වර්ෂයකට 22%ක පොළිය ද;

4. වර්ෂ 2025.05.13 දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දෙසිය හතළිස් අට ලක්ෂ දස දහස් හත්සිය තිස් හයයි ශත හතළිස් හය (රු. 24,810,736.46) ක මුදලක් ද, වර්ෂ 2025.05.14 දින සිට රුපියල් එකසිය හැත්තෑ නව ලක්ෂ අසූ තුන් දහස් පන්සිය අසූ පහයි ශත හතළිස් එක (රු. 17,983,585.41)ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 22%ක පොළිය ද;

5. වර්ෂ 2025.05.13 දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් එකසිය හැට අට ලක්ෂ පනස් නව දහස් පනස් හතයි ශත දාහතර (රු. 16,859,057.14) ක මුදලක් ද, වර්ෂ 2025.05.14 දින සිට රුපියල් අනූ නව ලක්ෂ තිස් හත් දහස් නවසිය විසි නවයයි ශත පනස් හතර (රු. 9,937,929.54) ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 22%ක පොළිය ද;

6. වර්ෂ 2025.05.13 දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් එකසිය ලක්ෂ අසූ හය දහස් එකසිය හතරයි ශත අසූ එක (රු. 10,086,104.81) ක මුදලක් ද, වර්ෂ 2025.05.14 දින සිට රුපියල් හැට දෙලක්ෂ දොළොස් දහස් පන්සිය පනස් අටයි ශත පනස් පහ (රු. 6,212,558.55) ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 22%ක පොළිය ද;

7. වර්ෂ 2025.05.13 දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හතළිස් හතර ලක්ෂ හතළිස් දෙදහස් අටසිය හැත්තෑ එකයි ශත දහ නවය (රු. 4,442,871.19) ක මුදලක් ද, වර්ෂ 2025.05.14 දින සිට රුපියල් විසිපන් ලක්ෂ පනස් නව දහස් නවසිය තිස් තුනයි ශත පනස් හතර (රු. 2,559,933.54) ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 22%ක පොළිය ද;

ඉහත කී බන්ධනදායින්/ උකස්කරුවන්ගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

ඒ කෙසේ ද යත්, ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු එකී මුදල වන රුපියල් එකසිය හතළිස් හය මිලියන නව ලක්ෂ එක් දහස් හත්සිය දහ අටයි ශත හය (රු. 146,901,718.06) ක මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට දේපළ විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙ හි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව අංක 50/3, විහාර මාවත, කොළොන්නාව දරන ස්ථානයෙ හි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (කොළඹ ලියාපදිංචි කොට්ඨාසයේ), කොළඹ මහ නගර සභා සීමාවේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරැල්ල දකුණ, කුරුඳුවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බොරැල්ල දකුණ කොට්ඨාස අංක 35 හි ෆෙයා ෆීල්ඩ් ගාර්ඩ්න්ස් හි පිහිටි, ෆෙයා ෆීල්ඩ් ගාර්ඩ්න්ස් නැමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. බෙල්ලන විසින් සම්පාදිත 2003.09.24 දිනැති අංක 884/2003 දරන පිඹුරේ දැක්වෙන (බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. බෙල්ලන විසින් මැන සාදන ලද 1991.03.31 දිනැති අංක 172/91 දරන පිඹුරේ ලොට් A1 නැවත මැනීමකි) ලොට් A1 දරන ෆෙයා ෆීල්ඩ් ගාර්ඩ්න්ස්, වරිපනම් අංක 10 දරන ඉඩමට උතුරට: ෆෙයා ෆීල්ඩ් ගාර්ඩ්න්ස්, වරිපනම් අංක 12 දරන පරිශ්‍රය (පිඹුරු අංක 3520 හි ලොට් 5A) ද; නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. බෙල්ලන විසින් මැන සාදන ලද 1991.03.31 දිනැති අංක 172/91 දරන පිඹුරේ දැක්වෙන ලොට් A2, ෆෙයා ෆීල්ඩ් ගාර්ඩ්න්ස්, වරිපනම් අංක 10A දරන පරිශ්‍රය ද; දකුණට : ඉහත කී පිඹුරු අංක 172/91 හි ලොට් A3 (ලොට් A2 සඳහා වූ අඩි 12 පළල මාර්ග රක්ෂිතය) ද සහ බස්නාහිරට : පාර (ෆෙයා ෆීල්ඩ් ගාර්ඩ්න්ස්) ද මායිම් වූ එකී අංක 884/2003 දරන පිඹුර පරිදි ප්‍රමාණයෙන් පර්චස් දාහතරයි දශම පහ (පර්. 14.5)ක විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ අනෙකුත් සියලු දෙය වේ.

එකී ලොට් A1 දරන ඉඩම පහත විස්තර කර ඇති ඉඩමේ නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, (කොළඹ ලියාපදිංචි කොට්ඨාසයේ), කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභාව තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරැල්ල දකුණ කුරුඳුවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බොරැල්ල දකුණ කොට්ඨාස අංක 35 හි ෆෙයා ෆීල්ඩ් ගාර්ඩ්න්ස් හි පිහිටි ෆෙයා ෆීල්ඩ් ගාර්ඩ්න්ස් නැමති ඉඩම මැන බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. බෙල්ලන විසින් මැන සාදන ලද 1991.03.31 දිනැති අංක 172/91 දරන පිඹුරේ දැක්වෙන ලොට් A1 දරන (බලයලත් මිනින්දෝරු ජී. පී. වීරරත්න විසින් මැන සාදන ලද 1914 අගෝස්තු මස අංක 3520 දරන පිඹුරේ දැක්වෙන ලොට් 4 දරන ඉඩම පසුකාලීනව මනින ලදුව බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. බෙල්ලන විසින් මැන සාදන ලද 1989.10.19 දිනැති අංක 91/89 දරන පිඹුරේ දැක්වෙන ලොට් A නැමති ඉඩමෙ හි බෙදා වෙන් කිරීමක් වන) ෆෙයා ෆීල්ඩ් ගාර්ඩ්න්ස්, වරිපනම් අංක 10 දරන ඉඩම : උතුරට : ෆෙයා ෆීල්ඩ් ගාර්ඩ්න්ස්, වරිපනම් අංක 12 දරන පරිශ්‍රය (ඉහත සඳහන් පිඹුරු අංක 3520 හි ලොට් 5A) ද; නැගෙනහිරට : මෙම ඉඩමෙ හි ලොට් A2 ද; දකුණට : මෙම ඉඩමෙ හි ලොට් A3 ද සහ බස්නාහිරට : පාර (ෆෙයා ෆීල්ඩ් ගාර්ඩ්න්ස්) ද මායිම් වූ එකී අංක 172/91 දරන පිඹුර පරිදි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම පහ (පර්. 14.50)ක විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ අනෙකුත් සියලු දෙය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. එල්. හල්වතුර,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණි -
ණය අයකර ගැනීම්.

11 - 347

---

### ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳව දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2025 ඔක්තෝබර් මස 29 දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. ටී. එල්. නන්දන විසින් ලියා සහතික කරන ලද 2011.01.21 දිනැති අංක 6931, ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. එස්. කුලසිංහ විසින් ලියා සහතික කරන ලද 2015.11.09 දිනැති අංක 154 සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ආර්. තිස්කුමාර විසින් ලියා සහතික කරන ලද 2018.11.02 දිනැති අංක 816 සහ 818 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, සිය ලියාපදිංචි කාර්යාලය ගාල්ලේ පවත්වාගෙන යන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද PV2613 දරන ඩේවිඩ්සන් ටී කම්පනි (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මෙහි මින්මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2024 අප්‍රේල් මස 30 දිනට එකී ඩේවිඩ්සන් ටී කම්පනි (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙතින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 816, 818, 154 සහ 6931 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් පනස් මිලියන හාර ලක්ෂ අනූ දෙදහස් අටසිය හැටයි ශත හතළිස් හයක (රු. 50,492,860.46) මුදලක් ද, 2024 මැයි මස 01 දින විකිණීමේ දිනය දක්වා රුපියල් දහ හත් මිලියන පන් ලක්ෂ අසූ හතර දහස් අනූ හයයි ශත අසූ එකක (රු. 17,584,096.81) මුදල මත වර්ෂයකට සියයට අටයි දශම හතයි පහක් (8.75%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් අසූ හය ලක්ෂ විසි එක් දහස් පන්සිය විසි නවයයි ශත පනස් නවයක (රු. 8,621,529.59) මුදල මත වර්ෂයකට සියයට අටයි දශම නවයයි තුනක් (8.93%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් දෙ ලක්ෂ තිස් හය දහස් අටසිය තිස් පහයි ශත අසූ දෙකක (රු. 236,835.82) මුදල මත වර්ෂයකට සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් එක් ලක්ෂ හැත්තෑ දහස් අටසිය අසූ හතයි ශත හතළිස් තුනක (රු. 170,887.43) මුදල මත වර්ෂයකට සියයට දෙකක් (2%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් දස මිලියන නව ලක්ෂ අසූ තුන් දහස් එකසිය හැට හයයි ශත අනූ එකක (රු. 10,983,166.91) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන ආසන්නතම 0.5%ට වටයනු ලබන්නා වූ සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට පහයි දශම පහක් (5.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් හැත්තෑ එක් ලක්ෂ පනස් හත් දහස් දෙසිය හැත්තෑ හයයි ශත පනස් දෙකක (රු. 7,157,276.52)ක මුදල මත වර්ෂයකට සියයට දහ නවයක් (19%) බැගින් වූ ස්ථිර අනුපාතය මග ගණනය කරනු ලබන පොළිය ද, අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් පනස් මිලියන හාර ලක්ෂ අනූ දෙදහස් අටසිය හැටයි ශත හතළිස් හයක (රු. 50,492,860.46) මුදලක් ද, 2024 මැයි මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් දහ හත් මිලියන පන් ලක්ෂ අසූ හතර දහස් අනූ හයයි ශත අසූ එකක (රු. 17,584,096.81) මුදල මත වර්ෂයකට සියයට අටයි දශම හතයි පහක් (8.75%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් අසූ හය ලක්ෂ විසි එක් දහස් පන්සිය විසි නවයයි ශත පනස් නවයක (රු. 8,621,529.59) මුදල මත වර්ෂයකට සියයට අටයි දශම නවයයි තුනක් (8.93%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් දෙ ලක්ෂ තිස් හය දහස් අටසිය තිස් පහයි ශත අසූ දෙකක (රු. 236,835.82) මුදල මත වර්ෂයකට සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් එක් ලක්ෂ හැත්තෑ දහස් අටසිය අසූ හතයි ශත හතළිස් තුනක (රු. 170,887.43) මුදල මත වර්ෂයකට සියයට දෙකක් (2%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් දස මිලියන නව ලක්ෂ අසූ තුන් දහස් එකසිය හැට හයයි ශත අනූ එකක (රු. 10,983,166.91) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන ආසන්නතම 0.5%ට වටයනු ලබන්නා වූ සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට පහයි දශම පහක් (5.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් හැත්තෑ එක් ලක්ෂ පනස් හත් දහස් දෙසිය හැත්තෑ හයයි ශත පනස් දෙකක (රු. 7,157,276.52)ක මුදල මත වර්ෂයකට සියයට දහ නවයක් (19%) බැගින් වූ ස්ථිර අනුපාතය මග ගණනය කරනු ලබන පොළිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරි වී ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැය කර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අය කිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 816, 818, 154 සහ 6931 දරන උකස් බැඳුම්කරයන් මගින් ඩේවිඩ්සන් ටී කම්පනි (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ ගොඩනැගිල්ල බලයලත් වෙන්දේසිකරු චන්දිමා ප්‍රියදර්ශනි ගමගේ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

**අංක 816, 818, 154 සහ 6931 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තුව දකුණ, වඳුරඹ පිහිටි බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බද්දේගම ප්‍රාදේශීය සභා බලසීමාව තුළ 221/A, වඳුරඹ දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි ඩේවිඩ්සන් ගෲප් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එෆ්. ගුරුගේ විසින් සාදන ලද 1981 දෙසැම්බර් මස 10 දිනැති අංක 2376 දරන පිඹුරේ දැක්වෙන ලොට් A වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : එම වත්තේ (Estate) ම කොටසක් ද; නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : එම වත්තේ (Estate) ම කොටසක් වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් පහක් (අ.1, රූ.2, පර්. 05)ක් විශාල ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග ඉහත කී පිඹුර පරිදි මාවත ප්‍රවේශයන් ද ඇතුළත්ව වේ.

වඩාත් මෑතක දී කරන ලද නැවත මැනීමකට අනුව මෙම ඉඩම පහත පරිදි විස්තර කෙරේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තුව දකුණ, වඳුරඹ පිහිටි බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බද්දේගම ප්‍රාදේශීය සභා බලසීමාව තුළ 221/A, වඳුරඹ දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි ඩේවිඩ්සන් ගෲප් නමැති

ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඩී. ඒ. ගුණසේකර විසින් සාදන ලද 1996 දෙසැම්බර් මස 14 දිනැති අංක 1573 දරන පිඹුරේ දැක්වෙන සහ එම මිනින්දෝරුවරයාම විසින් 2005 සැප්තැම්බර් මස 28 දින එම පිඹුරේ තබන ලද සටහන පරිදි ලොට් $A^1$ වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : එම වත්තේ (Estate) ම කොටසක් ද; නැගෙනහිරට : එම වත්තේ (Estate) ම කොටසක් ද; දකුණට : එම වත්තේ (Estate) ම කොටසක් සහ බස්නාහිරට : එම වත්තේ (Estate) ම කොටසක් ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් පහක් (අ.1, රූ.2, පර්. 05) විශාල ඉඩම එකී පිහිටි පස, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග ඉහත කී පිඹුර පරිදි මාර්ග ප්‍රවේශයන් ද ඇතුළත්ව වේ.

| *ප්‍රමාණය* *[QUANTITY]* | *විස්තරය* *[DESCRIPTION]* |
|---|---|
| 03 | විදරිං ටෲස් [Withering Troughs] |
| 06 | ටී රෝලර්ස් ටුගෙදර්විත් වන් යුනිට් ඔෆ් රෝලිං ඔටොමේෂන් සිස්ටම් [Tea Roller together with one unit of rolling automation system] |
| 01 | 5' ඩ්‍රයර් [5' Drier] |
| 02 | සක්ෂන් විනෝවර්ස් [Suction Winnowers] |
| 05 | මිචි ශිෆ්ටර්ස් [Michi Sifters] |
| 02 | මිඩ්ල්ටන් ශිෆ්ටර්ස් [Middleton Sifters] |
| 01 | ෆයිබර් මැට් [Fiber mat] |
| 01 | නැන්ටා කලර් සෙපරේටර් [Nanta Colour Seperator] |
| 01 | සුසුඔකා කලර් සෙපරේටර් [Susuoka Colour Separator] |
| 01 | ජෙනරේටර් 30 කේවී [Generator 30KV] |
| 01 | ඉලෙක්ට්‍රිසිටි සිස්ටම් [Electricity System] |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

11 - 319

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.